# කාර්යසාධන වාර්තාව - 2023

වැය ශීර්ෂය - 296

## ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

## පාලක ජනරාල්ගේ පණිවුඩය



මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ පවතින 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත මඟින් ස්ථාපිත ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවෙහි 2023 වර්ෂයේ කාර්යසාධන වාර්තාව නිකුත් කරන මෙම අවස්ථාවේ දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් වශයෙන් පණිවුඩයක් නිකුත් කරනු ලබන්නේ මහත් අභිමානනීය ප්‍රමෝදයෙනි.

ආනයන හා අපනයන පාලන පනතට අනුකූලව මෙරට ආරක්ෂාව, ආර්ථිකය, මහජන සෞඛ්‍යය, පරිසර සංරක්ෂණය ආදිය සැලකිල්ලට ගෙන තිරසර සංවර්ධිත රටක් උදෙසා ආනයන හා අපනයන ක්‍රමවේදය නියාමනය යන "මෙහෙවර" ඔස්සේ දෙපාර්තමේන්තුව මෙහෙයවීමට 2023 වර්ෂයේ දී නව දැක්මක් සකස් කර හඳුන්වා දෙමින් කටයුතු ආරම්භ කරන ලදී.

උක්ත පරිදි දිශානතික වූ කාර්යභාරය ක්‍රියාත්මක කිරීමෙහිලා අතිවිශේෂ ගැසට්පත්‍ර 14 ක් අවස්ථාවෝචිතව අමාත්‍යාංශ ලේකම්තුමාගේ උපදෙස් සහ අධීක්ෂණය යටතේ ගරු මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගේ අනුමැතිය මත නිකුත් කිරීමට කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකා ආර්ථිකය ප්‍රධාන වශයෙන් ආනයනය ප්‍රමුඛ කරගනිමින් ගොඩනැගුණු වාණිජ්‍යාමය පසුබිමක් පදනම් කරගෙන ඇති බැවින්, ආර්ථික අර්බුදකාරී තත්ත්වයක් හමුවේ එකී ආනයනික භාණ්ඩවල ගුණාත්මකභාවය සහ ප්‍රාමාණික වශයෙන් විශේෂයෙන් නිමි භාණ්ඩ හා පාරිභෝජන භාණ්ඩ සඳහා මෙරට තුළ උපයෝගිතාවයේ අරපිරිමැසුම්දායක මිම්මකට අනුකූලව යම්යම් ආනයන සීමා කිරීම හෝ පාලනය හෝ අත්හිටුවීම හෝ තහනම් කිරීම් සම්බන්ධයෙන් ආනයන හා අපනයන පාලන පනතට යටත්ව රෙගුලාසි සම්පාදනය උදෙසා යුහුසුළුව කටයුතු කිරීමට 2023 වර්ෂයේ මුල් කාර්තුවල මෙම දෙපාර්තමේන්තුවට සිදුවිය.

උක්ත ආනයන සීමා කිරීම්, දේශීය ආර්ථිකයෙහි වන සුබදායි ධනාත්මක ඉදිරි දැක්ම මත පදනම්ව,මෙරට ව්‍යාපාරික ප්‍රජාවගේ අවශ්‍යතාවයන්ද සංවේදීව සලකා බලා, අන්තර් භාණ්ඩ නිෂ්පාදනයට ඉඩ සලසමින් හා මෙරට කර්මාන්තකරුවන්ට සහ ව්‍යවසායකයන්ට පහසුකම් සැපයීමේ අභිමාර්ථයද පෙරදැරිව 2023 වර්ෂයේ අවසන් කාර්තුවේදී, ශ්‍රී ලංකා මහ බැංකුව,මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය හා වෙළෙඳ සහ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා පවත්වමින් ක්‍රමිකව ලිහිල් කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව, 2023 වර්ෂය අවසන් වන විට අදියර 03 කින් ගැසට්පත්‍ර නිකුත් කරමින් ආනයනය තාවකාලික තහනම් කිරීමේ සීමා ලිහිල් කිරීම, ආනයන හා අපනයන පාලනය සම්බන්ධයෙන් ගත් සාධනීය කර්තව්‍යන් බවට පත්විණි.

තවද, ජාත්‍යන්තර වෙළෙඳාම තුළ ඉතා සුවිශේෂී වැදගත්කමක් දක්වන අංශයක් වන ආනයනකරුවන් විසින් භාවිත කරනු ලබන ගෙවීම් ක්‍රම තුළින් මෙරට ආර්ථික මෙහෙයුම් පද්ධතියට ඇති කරවනු ලබන නිෂේධනීය බලපෑම් තුලනාත්මකව විශ්ලේෂණය කර විෂයානුබද්ධ ආයතනයන්හි මහ පෙන්වීමද ඇතුව එතෙක් පැවති ගෙවීම් ක්‍රම නියාමනය සඳහා දායක වීමද,මෙරට පුරවැසියා සෑම අතින්ම ආර්ථිකමය රාමුවෙහි සුරක්ෂිත කරලනු වස් දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබූ අවස්ථානුකූල වැදගත් පියවරකි.

දෙපාර්තමේන්තු විෂය පථයට මැනවින් සංවේදීව හා සඵලදායිව කටයුතු කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ සියලු ස්ථරයන්හි නිලධාරීන් උදෙසා විෂයානුබද්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු යෙදීම මෙන්ම, කාර්යාලීය වපසරිය ව්‍යාප්ත කරමින් අංශ හා ඒකක කිහිපයක් සඳහා සුදුසු ස්ථාන අභිනවයෙන් ස්ථාපිත කොට දෙපාර්තමේන්තුවේ මානව සම්පත් හා භෞතික සම්පත් සංවර්ධනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී. ඒ අතරම දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන සේවාදායකයින්ගේ පහසුව සඳහා ඒ ඒ ඒකකවල විෂයන්ට අනන්‍ය වූ සේවා කවුළු ස්ථාපිත කිරීමත් එම කවුළු සඳහා වෙන් වෙන්ව නිලධාරීන් යෙදවීමත් දෙපාර්තමේන්තුව ගත් ජයග්‍රාහී කාර්යසාධනයෙහි තවත් දිගුවකි.

හඳුනාගත් තිරසර සංවර්ධන ඉලක්ක ඔස්සේ දෙපාර්තමේන්තුව විසින් ස්වකීය දැක්ම හා මෙහෙවර ඉදිරියට ගෙන යමින් ස්ථාවරව හා විධිමත්ව පවත්වා ගැනීම සඳහා නූතන තාක්ෂණය සමඟ මුසුවෙමින්

දෙපාර්තමේන්තුවේ පවතින මාර්ගගත පරිගණක පද්ධතිය යාවත්කාලීන කිරීම සහ ඒ හරහා ලොව සංවර්ධිත රටවල් සමඟ කරට කර වන තාක්ෂණික පද්ධති සමඟ මුසුවීමේ කර්තව්‍යයද සාක්ෂාත් කරගැනීම සඳහා කටයුතු කර ඇත. ඒ අනුව, ඇමෙරිකානු රජයේ ආධාර මත එස්තෝනියා රාජ්‍යය මඟින් සකස් කළ ආනයන හා අපනයන බලපත්‍ර නිකුත් කිරීමේ මාර්ගගත පරිගණක පද්ධතියක් දෙපාර්තමේන්තුවට ලබා ගැනීම 2023 වර්ෂයේ අත්පත්කර ගත් සුවිශේෂී ජයග්‍රහණයකි. මේ වන විටත් සැලසුම් සහගත පියවරයන් අදාළ කාල රාමුවට අනුකූලව ඉතා සාර්ථකව අවසන් කර ඇති බවද සඳහන් කරමි.

ඉදිරියේදී මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය තවදුරටත් කාර්යක්ෂම කිරීම පිණිස දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය හා එක්ව දෙපාර්තමේන්තු ක්‍රියාවලීන් අධ්‍යයනය කොට තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා වැඩ පියවර රැසක් සැලසුම්කර ඇති අතර, ඒ සඳහා කාල රාමුද සකස් කොට තිබේ.

සමස්තයක් වශයෙන්, 2023 වර්ෂයේදී අපේක්ෂිත කාර්යසාධන ඉලක්කගතයන් සපුරා ගනිමින්, දෙපාර්තමේන්තුවේ දැක්ම වෙත ක්‍රමිකව පියවර තැබීමේ මාවත මැනවින් හෙළි පෙහෙළි කරලනු වස් විධායක නිලධාරීන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයම මා හට දැක්වූ දායකත්වය ද මෙම අවස්ථාවේදී කෘතවේදීව සිහිපත් කරමි.

තව ද, මෙම අභියෝගාත්මක කාල පරිච්ඡේදය තුළ මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මඟින් ලද මාර්ගෝපදේශකත්වය ද සැළකිය යුතු වේ. එමෙන්ම, මෙම දෙපාර්තමේන්තුවේ කාර්යය හා සෘජුවම බැඳුණු , ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු පද්ධතිය, අනෙකුත් බලපත්‍ර නිකුත් කිරීමේ දී නිර්දේශ සපයනු ලබන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සහාය ස්තුතිපූර්වකව මෙහි සඳහන් කරමි.

1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත මඟින් ආවරණය වන නෛතික රාමුව තුළ රජයේ ආර්ථික ප්‍රතිපත්ති හා අනුගත වෙමින් පෞද්ගලික අංශය බහුතරයක් වන සේවාලාභීන්ගේ අපේක්ෂාවන් ඉටුවන පරිදි ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව මෙහෙයවමින් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීමට ඇප කැප වන්නට දෙපාර්තමේන්තුවේ අපි සියල්ල එක්ව අදිටන් කර ගනිමු.

**ටී.ටී. උපුල්මලී ප්‍රේමතිලක**
ආනයන හා අපනයන පාලක ජනරාල්

# පටුන


| | | |
|---|---|---|
| 1 | පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 01 |
| 1.1 | හැඳින්වීම | 01 |
| 1.2 | දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු | 02 |
| 1.3 | දෙපාර්තමේන්තුවේ වගකීම් හා කාර්යභාරය | 03 |
| 1.4 | සංවිධාන ව්‍යුහය හා සටහන | 04 |
| 2 | පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 07 |
| 2.1 | භාණ්ඩ ආනයනය හා අපනයන නියාමනය සම්බන්ධ ප්‍රතිපත්තිමය නියෝග | 07 |
| 2.2 | ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම | 13 |
| 2.3 | පසුගිය වසර 3 තුළ නිකුත් කරන ලද බලපත්‍ර පිළිබඳ දත්ත සමාලෝචනය | 21 |
| 2.4 | ආනයන හා අපනයන ගෙවීම් ක්‍රම සහ නියෝග | 23 |
| 2.5 | ශ්‍රී ලංකාවේ ආනයන හා අපනයන නියාමන හා පහසුකරණය | 25 |
| 2.6 | නව වැඩිදියුණු කිරීම් | 28 |
| 2.7 | ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කිරීමට නියමිත STRATLINK පරිගණක මෘදුකාංග පද්ධතිය | 29 |
| 3 | පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය | 31 |
| 3.1 | 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය | 31 |
| 3.2 | 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 32 |
| 3.3 | 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 33 |
| 3.4 | ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය | 34 |
| 3.5 | 2023 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය | 35 |
| 3.6 | මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන | 35 |
| 3.7 | මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය | 35 |
| 3.8 | විගණකාධිපතිගේ වාර්තාව | 36 |
| 4 | පරිච්ඡේදය - කාර්යසාධන දර්ශකය | 44 |
| 4.1 | ආයතනයේ කාර්යසාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) | 44 |
| 5 | පරිච්ඡේදය - තිරසරසංවර්ධනඅරමුණු (SDG) සාක්ෂාත් කරගැනීමේ කාර්යසාධනය | 44 |
| 5.1 | හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු | 44 |
| 5.2 | තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග | 48 |
| 6 | පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ | 48 |
| 6.1 | සේවක සංඛ්‍යා කළමනාකරණය | 48 |
| 6.2 | දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම | 49 |
| 6.3 | මානව සම්පත් සංවර්ධනය | 49 |
| 7 | පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව | 52 |
| | සමාප්ති සටහන | 57 |

# 1 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

ක්‍රි.ව. දහවන සියවසේදී IV වන උදය රජ සමය දක්වා දිවෙන දිර්ඝ ඉතිහාසයක් සහිත සුරක්ෂිත හා ප්‍රමිතිගත ආනයන හා අපනයනය, 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත පාදක කර ගනිමින් ස්ථාපිත ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව හරහා වඩාත් විධිමත් හා අන්තර් ජාතික වෙළෙඳාමට සරිලන අයුරින් ජාත්‍යන්තර වෙළෙඳාම පහසු කාරක භූමිකාවක් දක්වා වර්තමානය තෙක් විකාශනය වී තිබේ. ඒ අනුව, පැවැති ආර්ථික අර්බුදකාරි තත්ත්වය හමුවේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව හා අනෙකුත් අදාළ පාර්ශ්වයන්ගේ අදහස්,යෝජනා, නිරීක්ෂණ හා උපදෙස් සමඟ ඒකාබද්ධ වෙමින් අවස්ථානුකූල පරිදි සාම්ප්‍රදායික කාර්ය භාරයෙන් ඔබ්බට යමින් උපායමාර්ගික ප්‍රවේශය ඔස්සේ එකී පනතේ බලතල ප්‍රකාරව ආනයන සීමා කිරීම් හා ගෙවීම් ක්‍රම පාලනය හරහා සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කරන ලද මෙම දෙපාර්තමේන්තුව එම අර්බුදකාරී තත්ත්වය පහව යාමේ ධනාත්මක ප්‍රවණතාවය පිළිබඳ අවධානය යොමු කරමින්, පනවන ලද මූලික ආනයන සීමා කිරීම් බොහොමයක් පාහේ ඉවත් කිරීම මේ වන විට සිදු කර තිබේ. ඒ සඳහා අතිරේක වශයෙන් අතිවිශේෂ ගැසට්පත්‍ර විශාල ප්‍රමාණයක් නිකුත් කිරීමට 2023 වර්ෂය තුළදී මෙම දෙපාර්තමේන්තුවට හැකිවිය.

ජාතික ආරක්ෂාව, පරිසර සංරක්ෂණය, යහපත් සෞඛ්‍ය හා ආර්ථික සුරක්ෂිතතාව අරභයා ආනයනය හා අපනයන භාණ්ඩයන්හි සංඛ්‍යාත්මක හා ගුණාත්මකභාවය උදෙසා ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය වඩාත් ඵලදායී හා කාර්යක්ෂම ලෙස සේවාලාභීන් තෘප්තිමත් වන අයුරින් ඉටු කිරීමට හැකි සෑම පියවරක්ම මෙම දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබේ. එහිදී බාසල්, මොන්ට්‍රියල් ඇතුළු පරිසරය සම්බන්ධ ජාත්‍යන්තර සම්මුතීන් හා අනුගත වෙමින් අදාළ ආනයන පාලනයන් සිදු කරයි තවද, භාණ්ඩ ආනයනයේදී ඒවායේ ප්‍රමිතිය නිර්ණය කිරීම මඟින් මහජන සෞඛ්‍ය ආරක්ෂාවට අදාළ විධි විධාන පනවනු ලැබීය. ඒ අනුව, ආනයනික භාණ්ඩ 123 ක් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති අනිවාර්ය කර ඇත. ඊට අමතරව ජාතික ආරක්ෂාව සලකා බැලීමේදී එක්සත් ජාතීන්ගේ 1540 යෝජනාවට අනුකූල නව නීතිරීති සකස් කිරීමට පියවර ගෙන ඇත.

2024 වර්ෂයේදී බලපත්‍ර නිකුත් කිරීම හා හර කිරීම මෙන්ම, අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා නව මාර්ගගත ක්‍රමයක් හඳුන්වා දීමට අදාළ මූලික අඩිතාලම මෙම වර්ෂයේදී සකසා ඇත. එමඟින් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් මහජනතාවට සැපයීමට හැකිවනු ඇතැයි බලාපොරොත්තු වෙමු.

## 1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

### 1.2.1 ආයතනික දැක්ම

තිරසර සංවර්ධිත රටක් උදෙසා
ආනයනය හා අපනයනය නියාමනය

### 1.2.2 ආයතනික මෙහෙවර

රටේ ආරක්ෂාව, ආර්ථිකය, මහජන සෞඛ්‍යය, පරිසර සංරක්ෂණය ආදිය සැලකිල්ලට ගෙන, භාණ්ඩ ආනයන හා අපනයන පාලනය සම්බන්ධයෙන් රජය විසින් වරින්වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත අනුව ක්‍රියාත්මක කිරීම.

### 1.2.3 අරමුණු

රටේ ආරක්ෂාව තහවුරු කිරීම, ආර්ථිකය නංවාලීම සහ මහජන සෞඛ්‍යය හා පරිසරය ආරක්ෂා කිරීම සඳහා රජය විසින් කලින් කලට ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට අනුකූලව ආනයන හා අපනයන නියාමනය කිරීම.

## 1.3 දෙපාර්තමේන්තුවේ වගකීම් හා කාර්යභාරය

i. ආනයන හා අපනයන පාලනයට අදාළ රෙගුලාසි ඇතුළත් අතිවිශේෂ ගැසට් නිවේදන ප්‍රකාශයට පත් කිරීම.

ii. ආනයන හා අපනයන පාලනයට අදාළවන මෙහෙයුම් මාර්ගෝපදේශ, වාණිජ බැංකුවලට, ශ්‍රී ලංකා රේගුවට හා අනෙකුත් ආයතන වෙත නිකුත් කිරීම.

iii. ආනයන හා අපනයන පාලනය සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන රෙගුලාසිවලට අදාළවන පරිදි අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම.

iv. ආනයන හා අපනයන පාලන රෙගුලාසිවලට යටත්ව මෙරට ආර්ථිකයේ යහපත උදෙසා බලපත්‍ර නිකුත් කිරීම සහ නියාමනය කිරීම.

v. බලපත්‍ර පාලනයට යටත් කළ අයිතම ආනයනයෙන් පසු හරපත්‍ර නිකුත් කිරීම.

vi. ආනයන හා අපනයන පාලන රෙගුලාසි හෝ බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරනු ලබන ආනයනකරුවන් සඳහා අතිරේක ගාස්තු පැනවීම.

vii. උපායමාර්ගික වෙළඳ කළමනාකරණ ක්‍රමයක් සහ ප්‍රමිතිකරණය වූ ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමයක් ඇති කිරීම සම්බන්ධයෙන් අදාළ රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම.

viii. දේශීය සහ විදේශීය වෙළෙඳාම දියුණු කිරීම සඳහා වන ලෝක වෙළඳ සංගමයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැපයීම.

ix. බාසල් සම්මුතිය, මොන්ට්‍රියල් සම්මුතිය ආදී ජාත්‍යන්තර සම්මුතීන්ට අනුගත වීම සඳහා පරිසර අමාත්‍යාංශය සමඟ එක්ව කටයුතු කිරීම.

x. ජාත්‍යන්තර වාණිජමය ගනුදෙනුවලට අදාළ වන රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම හා නියාමනය කිරීම.

xi. ආනයන හා අපනයන පාලන රෙගුලාසි සම්බන්ධයෙන් පැන නගින ගැටලු සහගත අවස්ථාවලදී රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත අවශ්‍ය සහාය / උපදෙස් ලබාදීම.

xii. දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ හැකියාව, නිපුණත්වය හා ඵලදායිතාවය වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා සේවක සුබසාධනය.

xiii. අදාළ රජයේ ගාස්තු එක්රැස් කර, ඒකාබද්ධ අරමුදලට බැර කිරීම.

## 1.4 සංවිධාන ව්‍යුහය හා සටහන

මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ ආයතන ප්‍රධානියා වශයෙන් ආනයන හා අපනයන පාලක ජනරාල් කටයුතු කරනු ලබයි.

1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත ප්‍රකාරව ක්‍රියාත්මක කරන නීතිරීති, රෙගුලාසි පැනවීම් හා ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම් ඇතුළු සමස්ත ආනයන හා අපනයන පාලන ක්ෂේත්‍රයේ කටයුතු නියාමනය කර ගැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුව පහත සඳහන් අංශ හා ඒකකවලින් සමන්විතව ක්‍රියාත්මක කරනු ලැබේ.

I. ආයතන අංශය
II. ගිණුම් අංශය
III. පර්යේෂණ හා ප්‍රතිපත්ති අංශය
IV. අභ්‍යන්තර විගණන අංශය
V. බලපත්‍ර නිකුත් කිරීමේ අංශ
- ඒකක 1 - ඖෂධ හා වෛද්‍ය උපකරණ
- ඒකක 2 - පාවිච්චි කරන ලද මෝටර් රථ සහ වාහන අමතර කොටස්
- ඒකක 3 - රසායනික ද්‍රව්‍ය, පොහොර, පළිබෝධනාශක හා කාර්මික අමුද්‍රව්‍ය ආනයනය හා අපනයන
- ඒකක 4 - ජංගම දුරකථන හා සන්නිවේදන උපකරණ හා වෙනත්
- ඒකක 5 - සතුන්, සත්ත්ව නිෂ්පාදන හා විවිධ ආනයන

VI. තොරතුරු තාක්ෂණ අංශය

මෙම කර්තව්‍යයන් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටුකර ගැනීම සඳහා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ තත්‍ය කාර්යමණ්ඩලය පහත සඳහන් සංවිධාන ව්‍යුහය (Organization Chart) යටතේ සේවාලාභීන් වෙත නිරතුරුව සේවය කිරීමට කැපවීමෙන් ක්‍රියාකරනු ලබයි.


2023.12.31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 122 ක් වන අතර, ජොෂ්ඨ මට්ටමේ සිට ප්‍රාථමික මට්ටම දක්වා පුරප්පාඩු 17 ක් පැවතියද පවතින කාර්ය මණ්ඩලය තුළ සේවාලාභීන් වෙත ප්‍රශස්ත සේවයක් ලබාදීමට 2023 වර්ෂයේදී කටයුතු කර ඇත.

කාර්ය මණ්ඩල තොරතුරු ලේඛනය පහතින් දැක්වේ.

## 2023.12.31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු

| තනතුර | සේවය/ ශ්‍රේණිය | | | | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | | | | |
| **ආනයන හා අපනයන පාලක ජනරාල්** | **ශ්‍රී.ලං.ප.සේ** | **විශේෂ** | **SL 3** | **විධායක** | **01** | **01** | **00** |
| ආනයන හා අපනයන පාලක | ශ්‍රී.ලං.ප.සේ | I | SL 1 | විධායක | 02 | 02 | 00 |
| ආනයන හා අපනයන පාලක (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) | දීප ව්‍යාප්ත සේවා | I | SL 1 | විධායක | 01 | 01 | 00 |
| නියෝජ්‍ය/සහකාර පාලක | ශ්‍රී.ලං.ප.සේ | II/III | SL 1 | විධායක | 06 | 04 | 02 |
| ප්‍රධාන ගණකාධිකාරි | ශ්‍රී.ලං.ග.සේ | I | SL 1 | විධායක | 01 | 01 | 00 |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ | I | SL 1 | විධායක | 01 | 01 | 00 |
| නීති නිලධාරි | දෙපාර්කමේන්තුගත | II/III | SL 1 | විධායක | 01 | 00 | 01 |
| සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා තාක්ෂණ) | ශ්‍රී.ලං.තො.තා.සේ | III | SL 1 | විධායක | 01 | 01 | 00 |
| | | | | | **14** | **11** | **03** |
| තෘතියික මට්ටම | | | | | | | |
| පරිපාලන නිලධාරි | ක.සේ.නි.සේ. | අධි | MN 7 | තෘතියික | 01 | 01 | 00 |
| භාෂා පරිවර්තක | භා.ප.සේ. | I/II | MN 6 | තෘතියික | 02 | 02 | 00 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | ශ්‍රී.ලං.තො.තා.සේ | II | MN 6 | තෘතියික | 01 | 01 | 00 |
| | | | | | **04** | **04** | **00** |
| ද්විතියික මට්ටම | | | | | | | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | ශ්‍රී.ලං.තො.තා.සේ. | III | MT 1 | ද්විතියික | 02 | 01 | 01 |
| දත්ත කළමනාකරණ සහකාර | දෙපාර්මේන්තුගත | | MN 4 | ද්විතියික | 01 | 01 | 00 |
| විමර්ශන සහකාර | දෙපාර්මේන්තුගත | | MN 4 | ද්විතියික | 01 | 01 | 00 |
| සංවර්ධන නිලධාරි | සං.නි.සේ | I/II/III | MN 4 | ද්විතියික | 23 | 22 | 01 |
| කළමනාකරණ සේවා නිලධාරි | ක.සේ.නි.සේ. | I/II/III | MN 2 | ද්විතියික | 57 | 50 | 07 |
| | | | | | **84** | **75** | **09** |
| ප්‍රාථමික මට්ටම | | | | | | | |
| රියැදුරු | රියදුරුසේ. | I/II/III | PL 3 | ප්‍රාථමික | 05 | 03 | 02 |
| කාර්යාල කාර්ය සහායක | කා.සේ.සේ. | I/II/III | PL 1 | ප්‍රාථමික | 15 | 12 | 03 |
| | | | | | **20** | **15** | **05** |
| **එකතුව** | | | | | **122** | **105** | **17** |

## සංවිධාන සටහන




| | | | |
|---|---|---|---|
| **නි.පා.** | - නියෝජ්‍ය පාලක | **දත්ත.ක.ස.** | - දත්ත කළමනාකරණ සහකාර |
| **ස.පා.** | - සහකාර පාලක | **විමර්ෂණ.ස.** | - විමර්ශණ සහකාර |
| **සහකාර අධ්‍යක්ෂ.තො.ත.** | - සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා තාක්ෂණ) | **ස.නි** | - සංවර්ධන නිලධාරී |
| **තො.ස.තා.නි** | - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | **ක.සේ.නි.** | - කළමනාකරණ සේවා නිලධාරී |
| **තො.ස.තා.ස** | - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | **කා.කා.ස.** | - කාර්යාල කාර්ය සහායක |
| **ප්‍ර.ක.සේ.නි.** | - ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී | | |

## 2. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### 2.1 භාණ්ඩ ආනයනය හා අපනයන නියාමනය සම්බන්ධ ප්‍රතිපත්තිමය නියෝග

කොවිඩ් -19 ගෝලීය වසංගතය සමඟ ඇති වූ මූල්‍ය අර්බුදය 2021, 2022 හා වර්ෂවලද අඛණ්ඩව පැවැති අතර, ඒ හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඉතා වේගවත් පසුබෑමට ලක් විය. විශේෂයෙන් එහි ප්‍රතිඵලයක් ලෙස ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව දිගින් දිගටම ශ්‍රී ලංකා රුපියලේ අගය ක්ෂය වීමක් පෙන්නුම් කෙරිණි මෙම ආර්ථික අර්බුදකාරී තත්ත්වය සමනය කරමින් ඊට මුහුණදීමට අවශ්‍ය වැදගත් පියවරයන් 2021, 2022 හා 2023 වර්ෂවලදී හඳුනාගන්නා ලදී. මෙහිදී, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කළ රෙගුලාසි හරහා විශේෂයෙන් 2020, 2021,හා 2022 වර්ෂයන් තුළ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ශ්‍රී ලංකාව තුළට ආනයනය කිරීම තාවකාලිකව අත්හිටුවීමත්, ගෙවීම් ක්‍රම නියාමනයට අදාළ රෙගුලාසි මඟින් විවෘත ගිණුම් මඟින් ආනයනය සඳහා බිල්පත් ගෙවීම සම්පූර්ණයෙන්ම තහනම් කිරීමත් සිදුකළ අතර, ප්‍රතිඅපනයනකරුවන් වන ආනයනකරුවන් සහ දේශීය කර්මාන්තකරුවන් එම සීමාවෙන් ඉවත් කරන ලදී. කෙසේවෙතත්, රජය විසින් අනුගමනය කරන ලද විවිධ ආර්ථික කළමනාකරණ ක්‍රමෝපායන් නිසා නැවත ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල ක්‍රමයෙන් යථා තත්වයට පත්වීම ඇරඹුණු අතර 2023 වර්ෂයේ සිට ක්‍රමයෙන් රටේ උද්ධමන අනුපාතය පහළ ගොස් ගෙවුම් ශේෂය මත වන පීඩනය අඩු වී ප්‍රාග්ධන භාණ්ඩ සඳහා ආයෝජනය ක්‍රමවත් වර්ධනය විමත් හේතුවෙන් ආර්ථිකයේ ධනාත්මක ඇරඹුමක් පිළිඹිබු කෙරිණි. ඒ අනුව, එතෙක් පනවා තිබූ ආනයන පාලන සීමා ලිහිල් කිරීමට 2023 වර්ෂයේ දී මූලික වශයෙන් කටයුතු කරන ලදී.

එහිදී, ශ්‍රී ලංකා මහ බැංකු විනිමය සංචිතය ඉහළ යාමත්, ඒ අනුව බලයලත් වාණිජ බැංකු සඳහා අවශ්‍ය ඇමරිකානු ඩොලර් ප්‍රමාණය නිකුත් කිරීම හේතු කොට ගෙන එම ආනයන සඳහා ගෙවීම් කිරීමට වාණිජ බැංකු වෙත තිබූ හැකියාව අවධානයට යොමු කරමින්, 2023 වසර තුළ අදියර කිහිපයක් යටතේ ආනයන හා අපනයන පාලන පනතේ විධිවිධාන ප්‍රකාරව නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට්පත්‍ර හරහා (වාහන හැරුණු කොට) ආනයනික භාණ්ඩ මත පනවා තිබූ තාවකාලික ආනයන තහනම සම්පූර්ණයෙන් ඉවත් කරන ලදී. 2023 වර්ෂය ආරම්භයේදීම ශ්‍රී ලංකා රේගුව හා වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව එක්ව ප්‍රකාශයට පත්කරන ලද 2023.01.01 දිනැති අංක 2312/75 දරන ගැසට් පත්‍රයට අනුකූලව මෙම දෙපාර්තමේන්තුව විසින් ආනයන පාලනයට යටත් භාණ්ඩ සඳහා වන නව සංයෝජිත වර්ගීකරණ ඇතුළත් අතිවිශේෂ ගැසට් පත්‍රයන් 2023 ජනවාරි මස 01 දින ප්‍රකාශයට පත්කරන ලදී. එම ගැසට් පත්‍රයන් තුළ, ආනයන බලපත්‍රයට යටත් කළ භාණ්ඩ 1051ක් (HS Codes) ද, සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකාව තුළට ආනයනය තහනම් කර ඇති භාණ්ඩ 49ක් (HS Codes) ද, නැවත දැනුම්දෙන තුරු ආනයන බලපත්‍ර නිකුත් කිරීම අත්හිටුවන ලද භාණ්ඩ 504ක් (HS Codes) සහ නැවත දැනුම් දෙන තුරු තාවකාලිකව අත්හිටුවා ඇති භාණ්ඩ 1218ක් ද (HS Codes) ප්‍රකාශයට පත්කරන ලදී.

#### 2.1.1 ආනයන හා අපනයන පාලන පනත යටතේ නව රෙගුලාසි නිකුත් කිරීම

| අනු අංකය | අතිවිශේෂ ගැසට් නිවේදන අංකය | දිනය | විස්තරය |
|---|---|---|---|
| 1 | 2312/77 | 2023.01.01 | 2022 වර්ෂයේදී ලෝක රේගු සංවිධානය විසින් හඳුන්වාදෙන ලද සංයෝජිත වර්ගීකරණ නාමකරණයේ (එච්. එස්) හත්වන සංස්කරණයට අනුකූලව ආනයන පාලන බලපත්‍ර අයිතම ලැයිස්තුව, තහනම් අයිතම ලැයිස්තුව සහ ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම තාවකාලිකව අත්හිටවූ අයිතම ලැසියිතුව යාවත්කාලීන කර ඒකාබද්ධ කිරීම |
| 2 | 2312/78 | 2023.01.01 | 2022 වර්ෂයේ දී ලෝක රේගු සංවිධානය විසින් හඳුන්වාදෙන ලද සංයෝජිත වර්ගීකරණ නාමකරණයේ (එච්. එස්) හත්වන සංස්කරණයට අනුකූලව ආනයනය තාවකාලික අත්හිටුවන ලැයිස්තු යාවත්කාලීන කර ඒකාබද්ධ කිරීම |

| අනු අංකය | අතිවිශේෂ ගැසට් නිවේදන අංකය | දිනය | විස්තරය |
|---|---|---|---|
| 3 | 2315/46 | 2023.01.19 | තිරිඟු පිටි, විවෘත ගිණුම් / භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යන ගෙවීම් ක්‍රම යටතේ ආනයනය සඳහා අවසර ලබාදුන් කාලය 2023 ජනවාරි 31 දක්වා දීර්ඝ කිරීම |
| 4 | 2320/46 | 2023.02.22 | විවෘත ගිණුම් ගෙවීම් ක්‍රමය යටතේ රජයේ අනුමත ව්‍යාපෘති / සංවර්ධන ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති භාණ්ඩ ආනයනය කිරීම සම්බන්ධයෙන් නිර්දේශ කිරීමේ වගකීම, විදුලිබල, ජල, මහාමාර්ග සහ වාරිමාර්ග විෂයභාර අමාත්‍යාංශවලට අදාළ ලේකම්වරුන් වෙත පැවරීමට අවසර ලබාදීම |
| 5 | 2320/47 | 2023.02.22 | ආනයනය තාවකාලිකව අත්හිටුවන ලද රූපලාවන්‍ය අයිතම (15 HS Codes) වර්ෂයක් සඳහා පෙර ආනයනවල (අවුරුදු 05 ක) සාමාන්‍ය අගයෙන් (සී.අයි.එෆ්) 50% කට සීමාකර ආනයනය කිරීම සඳහා අවසර ලබාදීම |
| 6 | 2324/45 | 2023.03.24 | ශ්‍රී ලංකා රේගුවේ නිෂ්පාදන බන්ධිත පහසුකම තුළ, ප්‍රති-අගුළු තිරිංග පද්ධතිය (ABS) නොමැතිව සිව්රෝද රථ නිෂ්පාදනය / එකලස් කිරීම සඳහා අවුරුදු 3ක සහන කාලයක් ලබා දීම |
| 7 | 2326/40 | 2023.04.06 | කිරි පිටි සහ රතු පරිප්පු, ගෙවීම් මත ලේඛන (DP) සහ පිළිගැනීම් මත ලේඛන (DA) යන ගෙවීම් ක්‍රම යටතේ ආනයනයේදී නාමමාත්‍ර ඉන්වොයිසි පිටසන් කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම. |
| 8 | 2326/41 | 2023.04.06 | ප්ලාස්ටික්වලින් නිර්මිත එක් වරක් පමණක් භාවිත කරන බීම බට, කැලතීමේ උපකරණ, පිඟන්, කෝප්ප (යෝගට් කෝප්ප හැර), යෝගට් හැඳි ඇතුළු හැඳි, ගැරුප්පු පිහි, සහ ප්ලාස්ටික් මල්මාලා හා ප්ලාස්ටික් ඉදිආප්ප වට්ටි ආනයනය කිරීම තහනම් කිරීම. |
| 9 | 2335/26 | 2023.06.09 | 2023 ජනවාරි 01 දිනැති 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මඟින් ආනයනය තාවකාලිකව අත්හිටුවන ලද සංයෝජිත වර්ගීකරණ සංකේත 1,218ක්වූ ලැයිස්තුවෙන් සංයෝජිත වර්ගීකරණ සංකේත 286 ක් ඉවත් කිරීම - (අදියර I) |
| 10 | 2336/45 | 2023.06.14 | තිරිඟු පිටි ආනයන බලපත්‍ර පාලනයට යටත් කිරීම. |
| 11 | 2341/38 | 2023.07.20 | • 2023 ජනවාරි 01 දිනැති 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මඟින් ආනයනය තාවකාලිකව අත්හිටුවන ලද සංයෝජිත වර්ගීකරණ සංකේත 1,218ක්වූ ලැයිස්තුවෙන් සංයෝජිත වර්ගීකරණ සංකේත 327 ක් ඉවත් කිරීම - අදියර II<br>• 2023 අංක 08 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මඟින් මීට පෙර තහනම් කරන ලද වරක් භාවිතකර ඉවත් කරන හැඳි ගැරුප්පු පිහි ආදී ප්ලාස්ටික් උපකරණ ආනයනය කිරීමට ජාත්‍යන්තර ගුවන් |

| අනු අංකය | අතිවිශේෂ ගැසට් නිවේදන අංකය | දිනය | විස්තරය |
|---|---|---|---|
| | | | සමාගම්වල මගීන්ට සේවා සැපයීම සඳහා ලියාපදිංචි ආහාර සැපයුම් සේවා සපයන්නන්ට අවසර ලබාදීම; |
| 12 | 2345/03 | 2023.08.14 | 2023 ජනවාරි 01 දිනැති 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මගින් ආනයනය තාවකාලිකව අත්හිටුවන ලද, සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 25ක් යටතේ වර්ග කර ඇති වාණිජ අරමුණු සඳහා යොදා ගැනෙන වාහන (බස් රථ, ලොරි රථ, ට්‍රක් රථ, ටැංකි, බවුසර් සහ විශේෂ කාර්ය ලොරි) ආනයනය සඳහා අවසර ලබා දීම |
| 13 | 2347/08 | 2023.08.29 | තිරිඟු පිටි බලපත්‍ර පාලනයට යටත් කරන ලද, 2023 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි අවලංගු කිරීම. |
| 14 | 2353/16 | 2023.10.09 | 2023 ජනවාරි 01 දිනැති 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මගින් ආනයනය තාවකාලිකව අත්හිටුවන ලද සංයෝජිත වර්ගීකරණ සංකේත 1,218ක් වූ ලැයිස්තුවෙන් සංයෝජිත වර්ගීකරණ සංකේත 299 ක් (මෝටර් වාහන හැර) ඉවත් කිරීම - (අදියර III)<br>සහ<br>දේශීය කෘෂිකර්මාන්තයට අගතියක් හෝ අවහිරයක් නොවන පරිදි කෘෂිකාර්මික භාණ්ඩ සඳහා ආනයන බලපත්‍ර පාලනයට යටත්ව ආනයනයට පහසුකම් සලසා දීම |

### අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2312/77 -2023.01.01

නව නිෂ්පාදන ප්‍රවාහයන් හඳුනා ගැනීම සහ ගෝලීය අවධානයට ලක්වන පාරිසරික හා සමාජීය ගැටලු ආමන්ත්‍රණය කිරීම තුළින් වත්මන් වෙළෙඳාමට අනුවර්තනය වීම යන ප්‍රධාන අංගයන් සමගින් 2022 දී ලෝක රේගු සංවිධානය විසින් සංයෝජිත වර්ගීකරණ නාමකරණයේ (එච්. එස්) හත්වන සංස්කරණය, එනම් එච්.එස් 2022 හඳුන්වාදෙන ලද අතර, ඒ අනුව නව ආදායම් ආරක්ෂණ නියෝග යාවත්කාලීන කර ඇත. ඊට අනුකූලව 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද පාලන ලැයිස්තු (ආනයන පාලන බලපත්‍ර අයිතම ලැයිස්තුව, තහනම් අයිතම ලැයිස්තුව සහ ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම තාවකාලිකව අත්හිටවූ අයිතම ලැයිස්තුව) යාවත්කාලීන කර ඒකාබද්ධ කිරීම සිදු කරන ලදී.

### අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2312/78 -2023.01.01

නව නිෂ්පාදන ප්‍රවාහයන් හඳුනා ගැනීම සහ ගෝලීය අවධානයට ලක්වන පාරිසරික හා සමාජීය ගැටලු ආමන්ත්‍රණය කිරීම තුළින් වත්මන් වෙළෙඳාමට අනුවර්තනය වීම යන ප්‍රධාන අංගයන් සමගින් 2022 දී ලෝක රේගු සංවිධානය විසින් සංයෝජිත වර්ගීකරණ නාමකරණයේ (එච්. එස්) හත්වන සංස්කරණය, එනම් එච්.එස් 2022 හඳුන්වාදෙන ලද අතර, ඒ අනුව නව ආදායම් ආරක්ෂණ නියෝග යාවත්කාලීන කර ඇත. ඊට අනුකූලව 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද පාලන ලැයිස්තු (තාවකාලික ආනයන අත්හිටුවීම) යාවත්කාලීන කර ඒකාබද්ධ කිරීම සිදු කරන ලදී.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2315/46 - 2023.01.19**

දේශීය වෙළඳපොළ් තිරිඟු පිටි මිල ස්ථාවරව පවත්වා ගැනීම සඳහා, 2023 ජනවාරි 31 දක්වා විවෘත ගිණුම් ගෙවීම් ක්‍රමය යටතේ තිරිඟු පිටි ආනයනය කිරීමට අවසර ලබා දෙන ලෙස ඉල්ලා, වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2022 දෙසැම්බර් 30 දිනැති අංක 23/0006/627/001 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දුන් 2023.01.10 දිනැති අනුමැතිය ප්‍රකාරව තිරිඟු පිටි, විවෘත ගිණුම් / භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යන ගෙවීම් ක්‍රම යටතේ ආනයනය සඳහා අවසර ලබා දුන් කාලය 2023 ජනවාරි 31 දක්වා දීර්ඝ කරන ලදී.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2320/46 - 2023.02.22**

සංශෝධිත 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම පිළිබඳ ආනයන පාලන රෙගුලාසි අනුව විවෘත ගිණුම් ගෙවීම් ක්‍රමය භාවිත කිරීම, ඍජු / වක්‍ර අපනයනකරුවන්, දේශීය නිෂ්පාදකයින් සහ සංවර්ධන ව්‍යාපෘති ඇතුළු රාජ්‍ය ආයතන සඳහා පමණක් සීමා කර ඇත. කෙසේවෙතත්, අපනයනකරුවන්ට, ආනයනකරුවන්ට සහ නැව් මාර්ගවලට පර්යන්ත සේවා සැපයීමෙන් විදේශ විනිමය උපයා ගන්නා පර්යන්ත ක්‍රියාකරුවන්, පර්යන්ත අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම, සහ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය අමතර කොටස්, උපකරණ සහ යන්ත්‍රෝපකරණ ආනයනය කිරීමේදී මුහුණ දෙන දුෂ්කරතාවන් සැලකිල්ලට ගනිමින්, විවෘත ගිණුම් ගෙවීම් ක්‍රමය යටතේ එවැනි භාණ්ඩ ආනයනය කිරීමටත් ඔවුන්ගේ විදේශ විනිමය ඉපැයුම් භාවිත කර බිල්පත් පියවීමටත් පහසුකම් සැලසීම සඳහා වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ලබා දී ඇති නිර්දේශ මත අවසර ලබා දෙන ලදී.

තවද, අනුමත කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කරමින් ඵලදායි නොවන වැඩ පියවර ඉවත් කිරීමේ අරමුණින් විවෘත ගිණුම් ගෙවීම් ක්‍රමය යටතේ රජයේ අනුමත ව්‍යාපෘති / සංවර්ධන ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති භාණ්ඩ ආනයනය කිරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම් වෙත පැවරී තිබූ නිර්දේශ කිරීමේ බලය, විදුලිබල, ජල, මහාමාර්ග සහ වාරිමාර්ග යන විෂයයන් සඳහා එක විෂයන් අයත් අමාත්‍යාංශවලට අදාළ ලේකම්වරුන් වෙත පැවරීමට අවසර ලබා දෙන ලදී.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2320/47 - 2023.02.22**

රූපලාවන්‍ය අයිතම ආනයනය තාවකාලිකව අත්හිටුවා ඇති නමුත් එම කර්මාන්තයේ යෙදෙන්නන්ගේ ඉල්ලීම පරිදි රූපලාවන්‍ය අයිතම ආනයනය සඳහා (15 HS Codes) ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ (SLTDA) නිර්දේශයට යටත්ව අවසර ලබා දෙන ලදී. කෙසේවෙතත්, රූපලාවන්‍ය හා පුද්ගලික සත්කාර සේවා සමාගම් තවදුරටත් සිදුකරන ලද ඉල්ලීම් මෙන්ම නිර්දේශ ලබා දීමේදී NMRA සහ SLTDA සඳහා පවතින සීමාවන් සැලකිල්ලට ගනිමින්, සිදුකරන රූපලාවන්‍ය අයිතම ආනයනය වර්ෂයක් සඳහා එම අයිතමවල පස් අවුරුදු සාමාන්‍ය අගයෙන් (සී.අයි.එෆ්) 50% කට සීමා කර ආනයනය කිරීම සඳහා අවසර ලබා දීම සිදු කරන ලදී.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2324/45 -2023.03.24**

2019 ජනවාරි මස 25 දිනැති අංක 2107/45 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2019 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි ප්‍රකාරව, සංයෝජිත වර්ගීකරණ සංකේත 87 පරිච්ඡේදය යටතේ වර්ගීකරණය කළ හැකි සියලුම මෝටර් රථ (සිව්රෝද රථ ඇතුළුව), එකී රෙගුලාසියේ නිශ්චිතව දක්වා ඇති පරිදි වාහන වායු විමෝචන ප්‍රමිති සහ ආරක්ෂක මිනුම් / ප්‍රමිතිවලට අනුකූල විය යුතුය. කේසේවෙතත් සංයෝජිත වර්ගීකරණ සංකේත 8703.21.63 සහ 8703.21.72 යටතේ ප්‍රති-අගුළු තිරිංග පද්ධතිය (ABS) නොසලකමින් දේශීයව නිෂ්පාදනය කරන සිව් රෝද රථ සඳහා නිෂ්පාදන බදු සහනය ලබා දීම" යන මැයෙන් වූ 2022 ඔක්තෝබර් 10 දිනැති අංක 22/1653/617/013 දරන අමාත්‍ය මණ්ඩල සටහනේ දක්වා ඇති යෝජනා සඳහා කර්මාන්ත අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා රේගුවේ නිෂ්පාදන බන්ධිත පහසුකම තුළ, ප්‍රති-අගුළු තිරිංග පද්ධතිය (ABS) නොමැතිව සිව්රෝද රථ නිෂ්පාදනය / එකලස් කිරීම සඳහා අවුරුදු 3 ක සහන කාලයක් ලබා දීම සිදු කරන ලදී. ශ්‍රී ලංකා රේගුව හා වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව එක්ව ප්‍රකාශයට පත්කරන ලද 2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/75 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව ආදායම් ආරක්ෂණ නියෝග

(RPO) මගින් සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවලට සිදු කරන ලද සංශෝධන (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක - 2022 සංස්කරණය) ප්‍රකාරව 2019 ජනවාරි මස 25 දිනැති අංක 2107/45 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද, මෝටර් වාහනවලට අදාළ සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යාවත්කාලීන කිරීමද සිදුකරන ලදී.

### අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2326/40 - 2023.04.06

වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2022 අගෝස්තු මස 19 දිනැති අංක 22/1260/627/007 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ දක්වා ඇති යෝජනා සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දුන් අනුමැතිය ප්‍රකාරව, කිරි පිටි සහ රතු පරිප්පු, ගෙවීම් මත ලේඛන (DP) සහ පිළිගැනීම් මත ලේඛන (DA) යන ගෙවීම් ක්‍රම යටතේ ආනයනය කිරීම, 2022 අංක 7 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසිවල අංක 6 හි නිශ්චිතව දක්වා ඇති පිටසන් කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම සඳහා ලබා දුන් අවසරය, 2023 ජනවාරි 19 දිනැති අංක 2315/46 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 03 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි මගින් ඉවත් කරන ලදී. කෙසේ වෙතත්, දේශීය වෙළෙඳපොළට කිරිපිටි සහ රතු පරිප්පු අඛණ්ඩව සැපයීම සහතික කිරීම සඳහා ඉහත සඳහන් නිදහස් කිරීම අඛණ්ඩව පවත්වාගෙන යන ලෙස ඉල්ලා සිටිමින් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනකරුවන් විසින් ඒ සඳහා වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයට කරුණු ඉදිරිපත් කරන ලදුව පිටසන් කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම නැවත බලාත්මක කිරීම සිදුකරන ලදී.

### අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2326/41 -2023.04.06

පරිසර අමාත්‍යාංශය විසින්, "තනි භාවිත ප්ලාස්ටික්/පොලිතීන් අපද්‍රව්‍ය පාලනය" යන මැයෙන් ඉදිරිපත් කරන ලද 2023 ජනවාරි මස 31 දිනැති අංක 23/0265/622/003 දරන අමාත්‍ය මණ්ඩල සටහනේ දක්වා ඇති යෝජනා සඳහා ලබා දුන් **2023.02.13 දිනැති** අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ප්‍රකාරව 2023 ජූනි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි,ප්ලාස්ටික් වලින් නිර්මිත එක් වරක් පමණක් භාවිත කරන ප්ලාස්ටික් බීම බට සහ කැලතීමේ උපකරණ ,පිඟන්, කෝප්ප (යෝගට් කෝප්ප හැර), යෝගට් හැඳි ඇතුළු හැඳි, ගෑරුප්පු සහ පිහි, ප්ලාස්ටික් මල්මාලා සහ ප්ලාස්ටික් ඉදිආප්ප වට්ටි ආනයනය තහනම් කිරීම සඳහා 2023 අංක 08 දරන ආනයන හා අපනයන පාලන රෙගුලාසිය පනවන ලදී.

### අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2335/26 -2023.06.09

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පවත්නා විස්තීරණ අරමුදල් පහසුකම් සැලසීම සඳහා සහය දක්වන ආර්ථික ප්‍රතිසාධන සහ අනුවර්තන වැඩසටහන සැකසීමේදී, 2023 ජනවාරි 01 දිනැති අංක 2312/78 අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති, 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි යටතේ පවතින භාණ්ඩ ආනයනය තාවකාලිකව අත්හිටුවීම අඛණ්ඩව පවත්වා ගෙන යාම සම්බන්ධව, රාජ්‍ය සහ පෞද්ගලික ආයතන ඇතුළු අදාළ පාර්ශ්වකරුවන්ගේ අවධානය යොමු විය. ඒ අනුව, 2023 අප්‍රේල් 06, සහ 2023 මැයි 19 යන දිනයන්හි දී කර්මාන්ත අමාත්‍යාංශයේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ පැවැති රැස්වීම්වලදී දැනට පවතින භාණ්ඩ ආනයනය තාවකාලිකව අත්හිටුවීමේ රෙගුලාසි ලිහිල් කිරීමට / උපලේඛනයෙන් භාණ්ඩ ඉවත් කිරීමට ඇති හැකියාව පිළිබඳව සාකච්ඡා කෙරිණි. තවද, ගෙවීම් ශේෂය මත (BOP) පීඩනය පදනම්ව සහ ඒවාට ප්‍රමුඛත්වය දෙමින් ක්‍රමානුකූලව එම සීමා / භාණ්ඩ ආනයනය තාවකාලිකව අත්හිටුවීම ලිහිල් කිරීම පිළිබඳව සලකා බලන ලෙස මහ බැංකු අධිපතිවරයා විසින් භාණ්ඩාගාර ලේකම්වරයා වෙත දැනුම් දී ඇත. මෙම පසුබිම තුළ, විවිධ ඉල්ලීම්, වාර්ෂික ආනයන බිල්පතේ ප්‍රමාණය සහ ප්‍රතිස්ථාපන අවශ්‍යතාවය මත පදනම්ව තාවකාලික අත්හිටුවීමේ උපලේඛනයේ සංයෝජිත වර්ගීකරණ සංකේත 1,216ක්වූ ලැයිස්තුවෙන් සංයෝජිත වර්ගීකරණ සංකේත 286ක් ඉවත් කිරීම සිදු කරන ලදී.

### අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2336/45 -2023.06.14

රුපියලේ අගය ඉහළ යාම සහ දේශීය වෙළෙඳපළේ තිරිඟු පිටි මිල කෙරෙහි එහි බලපෑම සලකා බැලීමෙන් අනතුරුව, රුපියලේ අගය ඉහළ යාමේ ප්‍රතිලාභ පාරිභෝගිකයින්ට ලබා දීමේ හැකියාව පිළිබඳ සාකච්ඡා කරනු වස් 2023 මැයි මස 31 සහ 2023 ජූනි මස 06 යන දිනවල ජනාධිපති ලේකම් කාර්යාලයේ දී, ජනාධිපති ජ්‍යෙෂ්ඨ ආර්ථික උපදේශක ඇතුළු නිලධාරීන් සහ දේශීය තිරිඟු පිටි නිෂ්පාදකයින්ගේ සහභාගීත්වයෙන් රැස්වීම් පවත්වන ලද අතර, එහිදී වෙළෙඳපළ අසමතුලිතතාවය ඉවත් කිරීමට තිරිඟු පිටි සෘජුවම ආනයනය කිරීම කෙටි කාලීනව (මාස දෙකේ සිට තුන දක්වා කාල පරිච්ඡේදයක් සඳහා) පාලනය කිරීම සඳහා, 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත යටතේ සීමා පැනවීමටත්, තිරිඟු පිටි ආනයනය සඳහා සුදුසු අනුපාතයකින් විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම මගින් තිරිඟු පිටි ආනයන බලපත්‍රය ප්‍රතිස්ථාපනය කිරීමටත් 2023 ජූනි මස 06 වැනි දින පැවති රැස්වීමේදී තීරණය කරන ලදී. ඒ අනුව තිරිඟු පිටි ආනයනය බලපත්‍ර පාලනයට යටත් කිරීම සිදු කරන ලදී.

### අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2341/38 -2023.07.20

ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් ද සමඟින් පවත්වන ලද ප්‍රතිපත්ති සාකච්ඡාවලදී එකඟ වූ යෝජනා සහ තීරණවලට අනුව, වෙළෙඳ කාර්යයන් සඳහා ලැබෙන සහයේ වැදගත්කම සහ ගෙවීම් ශේෂය මත (BOP) පීඩනය සඳහා ප්‍රමුඛත්වය දෙමින් ගෙවීම් ශේෂ (BOP) පීඩනය සැලකිය යුතු ලෙස අඩු වන තෙක් මගී මෝටර් රථ සහ සමහර තෝරාගත් භාණ්ඩ සඳහා ආනයන සීමා කිරීම් දිගටම බලපැවැත්වෙන අතරම, 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මගින් පනවන ලද තාවකාලික අත්හිටුවීම් ක්‍රමානුකූලව ලිහිල් කිරීමට තීරණය කර ඇත. මෙම පසුබිම තුළ, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, කර්මාන්ත අමාත්‍යාංශය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තාක්ෂණික කණ්ඩායම සමඟ සාකච්ඡා කර, හඳුනා ගන්නා ලද සංයෝජිත සංකේතාංක 327ක් තාවකාලික අත්හිටුවීමේ උපලේඛනයෙන් ඉවත් කිරීම සිදු කරන ලදී.

එමෙන්ම, ජාත්‍යන්තර ගුවන් සමාගම්වල මගීන්ට සේවා සැපයීමේ අරමුණින්, 2023 අංක 08 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මඟින් මීට පෙර තහනම් කරන ලද වරක් භාවිත කර ඉවත් කරන හැඳි ගෑරුප්පු පිහි ආදී ප්ලාස්ටික් උපකරණ ආනයනය කිරීම සඳහා ලියාපදිංචි ආහාර සැපයුම් සේවා සපයන්නන්ට අවසර ලබාදීම ද සිදු කරන ලදී.

### අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2345/03 -2023.08.14

කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් විනිමය අනුපාතිකය සහ මූල්‍ය වෙළඳපොළ මත වර්ධනය වන පීඩනය ලිහිල් කිරීම අරමුණු කර ගනිමින්, රජයේ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයක් ලෙස 2020 වසරේ සිට මෝටර් වාහන ඇතුළු ඇතැම් භාණ්ඩ ආනයනය කිරීම තාවකාලිකව අත්හිටුවා ඇත. ආර්ථික තත්ත්වය වර්ධනය වීම, ප්‍රතිපත්ති සමාලෝචන ඇතුළු ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් සලකා බලමින් ගෙවුම් ශේෂය මත (BOP) පීඩනය මත පදනම්ව සහ ඒවාට ප්‍රමුඛත්වය දෙමින් ආර්ථික වර්ධනයට උපකාරී වන ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින්, මෙම ආනයන සීමා ලිහිල් කිරීමේ ක්‍රියාවලිය ක්‍රමානුකූලව සිදු කරනු ලැබීය.

මෙවැනි පසුබිමක් තුළ, සංචාරකයින් ප්‍රවාහනය සඳහා බස් රථ ආනයනය කිරීම සම්බන්ධයෙන් අවසර දීමේ හැකියාව පිළිබඳ සොයා බලන ලෙස ජනාධිපති කාර්යාලය විසින් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයෙන් සහ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ඉල්ලා ඇත. ඒ අනුව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිරීක්ෂණ මත පදනම්ව, සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 25ක් යටතේ වර්ග කර ඇති වාණිජ අරමුණු සඳහා යොදා ගැනෙන වාහන (බස් රථ, ලොරි රථ, ට්‍රක් රථ, ටැංකි, බවුසර් සහ විශේෂ කාර්ය ලොරි) වාහන ආනයනය තාවකාලිකව අත්හිටුවීමේ උපලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරන ලදී. නමුත් මෙම ගැසට් පත්‍රය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත නොකිරීම හේතුවෙන් 1969 අංක 1 දරණ ආනයන හා අපනයන පාලන පනතේ 20 වන වගන්තිය ප්‍රකාරව, නෛතික අවශ්‍යතාවය සපුරාලීමට නොහැකි වීම හේතුවෙන්, එකී වගන්තිය ප්‍රකාරව ගැසට් පත්‍රය ප්‍රකාශයට පත්කල දින සිට මසක් තුළත දී ගැසට් පත්‍රය අවලංගු වන ලදී.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2347/08 -2023.08.29**

තිරිඟු පිටි ආනයනය සඳහා පනවා ඇති ආනයන බලපත්‍ර සීමාව ඉවත් කිරීම සම්බන්ධයෙන් රජයේ මුදල් පිලිබඳ කාරක සභාවේ අදහස් ද සැලකිල්ලට ගනිමින් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ පැවති සාකච්ඡාවේදී, තිරිඟු පිටි ආනයනයේදී ආනයන පාලන බලපත්‍රය ඉවත් කිරීමට යටත්ව, තිරිඟු ධාන්‍ය ආනයනය සම්බන්ධ රේගු ආනයන බදු සහනය සහ තිරිඟු පිටි ආනයනය සම්බන්ධ රේගු ආනයන බද්ද සංශෝධනය කිරීමට තීරණය විය. ඒ අනුව, තිරිඟු පිටි සඳහා ආනයන පාලන බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම සඳහා 2023 ජූනි මස 14 දිනැති අංක 2336/45 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පරිච්ඡින්න කිරීම සිදු කරන ලදී.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2353/16 - 2023.10.09**

2023 ජනවාරි 01 දිනැති අංක 2312/78 දරන ගැසට් නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල දක්වා ඇති පරිදි තාවකාලික අත්හිටුවීම යටතේ භාණ්ඩ ආනයනය සඳහා පනවා ඇති ආනයන සීමා, ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි දක්වන සහායයෙහි වැදගත්කම සහ එම සීමා ලිහිල් කිරීම මගින් ඇති විය හැකි ගෙවුම් ශේෂ පීඩන මත පදනම්ව ලිහිල් කිරීමේ තෙවන අදියර යටතේ ආනයනය තාවකාලිකව අත්හිටුවීමේ උපලේඛනයෙන් ඉතිරි සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 299 ක් (මෝටර් වාහන හැර) ඉවත් කිරීම සහ තීරුබදු සමාලෝචනය අවසන් වන තුරු දේශීයව නිෂ්පාදනය කරනු ලබන තෝරාගත් කෘෂිකාර්මික නිෂ්පාදන (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 25) ආනයන බලපත්‍රයක් පාලනයට යටත් කිරීම සිදු කරන ලදී.

### 2.1.2 මෙහෙයුම් උපදෙස් හා අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම

දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළ ප්‍රකාශිත ගැසට් නිවේදනයන්හි ඇතුළත් රෙගුලාසි පිළිබඳව ශ්‍රී ලංකා රේගුව, වාණිජ බැංකු හා දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුම්වත් කිරීම ඉතා වැදගත් වේ.

එබැවින්, ගැසට්පත්‍රයක් ප්‍රකාශයට පත්කරන සෑමවිටම අදාළ පාර්ශ්වයන්ගේ දැනුම්වත්භාවය උදෙසා මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීම හා අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීමකි. ඒ අනුව, 2023 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් මෙහෙයුම් උපදෙස් 10 ක් හා අභ්‍යන්තර චක්‍රලේඛ 19 ක් නිකුත් කිරීමට පියවර ගෙන ඇත.

## 2.2. ආනයන හා අපනයන බලපත්‍ර නිකුත් කිරීම

ආනයන හා අපනයන කටයුතු නියාමනය කරනු ලබන ආයතනයක් වශයෙන් මෙම දෙපාර්තමේන්තුව විසින් ආනයන හා අපනයන පාලනයට යටත් කරන ලද අයිතම සඳහා බලපත්‍ර නිකුත් කිරීම ප්‍රධාන කාර්යයක් වේ. ඒ අනුව, එකී කාර්යය විධිමත්ව හා ඵලදායිව සිදු කරමින් සේවාලාභීන් වෙත ගුණාත්මක සේවාවක් ලබා දීමට මෙම දෙපාර්තමේන්තුවේ ඒකක 5 ක් ස්ථාපිතකර ඇති අතර, එම ඒකකයන් මගින් බලපත්‍ර නිකුත් කිරීම සිදු කරනු ලබයි.

ඒ අනුව 2023 වර්ෂයේදී එක් එක් ඒකකයන් විසින් නිකුත් කරන ලද ආනයන හා අපනයන පාලන බලපත්‍ර සම්බන්ධ තොරතුරු පහත පරිදි වේ.


### 2.2.1. ඒකකය 01 - ඖෂධ සහ වෛද්‍ය උපකරණ

ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම සඳහා ඖෂධ සහ වෛද්‍ය උපකරණ ප්‍රධාන කාණ්ඩ පහකට වර්ග කර ඇති අතර, එක් එක් කාණ්ඩය යටතේ 2023 වර්ෂයේදී නිකුත් කරන බලපත්‍ර සංඛ්‍යාව පහත පරිදි වේ.

| අංකය | විස්තරය | කාණ්ඩය | බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | බටහිර ඖෂධ | 400 | 1,365 |
| 2 | පශු ඖෂධ | 410 | 309 |
| 3 | ආයුර්වේද ඖෂධ | 420 | 179 |
| 4 | හෝමියෝපති ඖෂධ | 430 | 14 |
| 5 | වෛද්‍ය උපකරණ | 450 | 78 |
| | එකතුව | | **1,945** |

2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතෙහි 109 වන වගන්තිය ප්‍රකාරව, ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ලබාදෙන අනුමැතිය යටතේ, ඖෂධ හා වෛද්‍ය උපකරණ සඳහා ආනයන බලපත්‍ර නිකුත් කිරීමට පෙර ගත යුතු ආරක්ෂාකාරී ක්‍රියාමාර්ග කිහිපයක් සහ ආනයන බලපත්‍ර සඳහා ඇතුළත් කළ යුතු විශේෂ කොන්දේසි මෙම ඒකකය විසින් හඳුනා ගන්නා ලදී. තවද, 2023 වර්ෂයට අදාළව ලබා ගන්නා ලද සමූහ ආනයන බලපත්‍ර භාවිතය පිළිබඳ පසුවිපරමක් සිදු කරන ලද අතර, නිකුත් කිරීමට අදාළ කොන්දේසි සමාලෝචනය සහ පිළියෙල කිරීම සිදුකරන ලදී

**ඖෂධ සහ වෛද්‍ය උපකරණ සඳහා නිකුත් කර ඇති බලපත්‍ර ගණන**





## 2.2.2 ඒකක 2 - පාවිච්චි කරන ලද මෝටර් රථ සහ වාහන අමතර කොටස්

මෙම ඒකකය මඟින් පාවිච්චි කරන ලද මෝටර් රථ සහ වාහන අමතර කොටස් හා වෙනත් අයිතම කිහිපයක් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු සිදුකරනු ලබන අතර 2023 වර්ෂයට අදාළව පහත පරිදි බලපත්‍ර නිකුත් කර ඇත.

| | විස්තරය | කාණ්ඩය | බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | විදේශගත ශ්‍රමිකයන් විසින් සිදුකරන පරිත්‍යාග | 110 | 02 |
| 2 | සමාජ සේවා ආයතන සඳහා පරිත්‍යාග | 150 | 07 |
| 3 | මෝටර් ට්‍රේලර් පාවිච්චි කළ | 185 | 02 |
| 4 | කෘෂිකාර්මික අංශය සඳහා වන පාවිච්චි කළ ට්‍රැක්ටර් | 190 | 02 |
| 5 | ගුවන් යානා සහ හෙලිකොප්ටර් අමතර කොටස් | 210 | 96 |
| 6 | එන්ජින් | 220 | 03 |
| 7 | යන්ත්‍ර සහ උපාංග | 225 | 05 |
| 8 | බොඩි ෂෙල් | 230 | 25 |
| 9 | පාවිච්චි කළ මෝටර් බයිසිකල් | 240 | 01 |
| 10 | ඉලෙක්ට්‍රික් මෝටර් බයිසිකල් | 242 | 138 |
| 11 | බයිසිකල් | 244 | 18 |
| 12 | හෙල්මට් | 245 | 21 |
| 13 | වැසි | 290 | 59 |
| 14 | ආසන (පාවිච්චි කළ වාහන ආසන) | 320 | 03 |
| 15 | පාවිච්චි කළ ඇඳුම් | 720 | 03 |
| එකතුව | | | 385 |

## පාවිච්චි කරන ලද මෝටර් රථ සහ වාහන අමතර කොටස් සඳහා නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යා




### 2.2.3 ඒකක 3 - රසායනික ද්‍රව්‍ය, පොහොර, පළිබෝධනාශක , කාර්මික අමුද්‍රව්‍ය ආනයනය හා අපනයන

**ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද රසායනික ද්‍රව්‍ය, පොහොර, පළිබෝධනාශක හා කාර්මික අමුද්‍රව්‍ය සහ අපනයන අයිතමයන් සඳහා 2023 වර්ෂය තුළ නිකුත් කරන ලද බලපත්‍ර පිළිබඳ විස්තර පහත පරිදි වේ.**

| | විස්තරය | කාණ්ඩය | බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | පූර්වජ රසායනික ද්‍රව්‍ය හා රසායනික ද්‍රව්‍ය | 500 | 508 |
| 2 | ඛනිජ තෙල් නිෂ්පාදන | 510 | 1,075 |
| 3 | කෘෂි රසායනික හැර අනෙකුත් රසායනික ද්‍රව්‍ය, කෘමිනාශක | 520 | 1,743 |
| 4 | විකිරණශීලී ද්‍රව්‍ය | 530 | 253 |
| 5 | මද්‍යසාර | 540 | 250 |
| 6 | රොන්මඩ තෙල් | 700 | 0 |
| 7 | ලෝහ, ලෝහ සුන්බුන් අපනයන | 710 | 213 |
| 8 | ලෝහ, ලෝහ සුන්බුන් ආනයන | 715 | 168 |
| 9 | කාබනික අපද්‍රව්‍ය | 735 | 46 |
| එකතුව | | | 4,256 |

**රසායනික ද්‍රව්‍ය, පොහොර, පළිබෝධනාශක , කාර්මික අමුද්‍රව්‍ය ආනයනය, අපනයන සඳහා නිකුත් කරන ලද බලපත්‍ර**




### 2.2.4 ඒකක 4 -ජංගම දුරකථන හා සන්නිවේදන උපකරණ හා වෙනත්

**2023 වර්ෂයේදී ජංගම දුරකථන හා සන්නිවේදන උපකරණ හා වෙනත් ආනයන සහ අපනයන සඳහා පහත පරිදි ආනයන බලපත්‍ර නිකුත් කර ඇත.**

| | විස්තරය | කාණ්ඩය | බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ජංගම දුරකථන (පාවිච්චි කළ / අලුත්) | 615 | 3128 |
| 2 | සන්නිවේදන උපකරණ | 620 | 1175 |
| 3 | ශීතකාරක වායු | 640 | 99 |
| 4 | වායු සමීකරණ යන්ත්‍ර | 645 | 228 |
| 5 | මුද්‍රණ යන්ත්‍ර | 690 | 142 |
| 6 | දුරස්ථ පාලකයකින් ක්‍රියා කරන සෙල්ලම් බඩු | 660 | 74 |
| 7 | භාවිතා කරන ලද ශීතකරණ, භාවිතා කරන ලද වායුසමීකරණ | 630 | 01 |
| 8 | තාප පොම්ප | 631 | 10 |
| 9 | විදුලි පෙනු සහ කෙවිනි | 655 | 65 |
| 10 | පරිගණක | 625 | 09 |
| 11 | ඉරන ලද ලී හා ලී කුට්ටි | 602 | 65 |
| 12 | ඇත්දළ හා ඇත්දළ සහිත භාණ්ඩ | 603 | 00 |
| 13 | පුපුරණ ද්‍රව්‍ය සහ ගිනි අවි | 600 | 153 |
| 14 | සිගරට් පේපර් | 670 | 49 |
| 15 | අපනයන | 605 | 00 |
| 16 | කාසි | 610 | 00 |
| 17 | භාවිතා කරන ලද රෙදි සෝදන යන්ත්‍ර | 635 | 00 |
| 18 | තැටි මගින් ක්‍රියාත්මක ක්‍රීඩා භාණ්ඩ කට්ටල සහ කාසි දැමීම මගින් ක්‍රියාත්මක ක්‍රීඩා උපකරණ | 650 | 00 |
| 19 | භාවිතා කරන ලද ගෘහ භාණ්ඩ | 680 | 03 |
| 20 | කියත් (සර්කියුලර් සෝ/ජිග් සෝ) | 685 | 17 |
| 21 | කාළගුණ බැලූන් | 695 | 00 |
| | එකතුව | | 5218 |

ජංගම දුරකථන හා සන්නිවේදන උපකරණ හා වෙනත් ආනයන සහ අපනයන සඳහා නිකුත් කළ බලපත්‍ර





## 2.2.5 ඒකක 5- සතුන්, සත්ත්ව නිෂ්පාදන හා විවිධ ආනයන

වෙනත් ආනයන සඳහා පහත පරිදි බලපත්‍ර නිකුත් කර ඇත.


| | විස්තරය | කාණ්ඩය | බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | සතුන් සහ සත්ත්ව නිෂ්පාදන | 550 | 1,642 |
| 2 | ලූණු | 505 | 26 |
| 3 | සීනි | 515 | 07 |
| 4 | ශීත කළ මසුන් | 555 | 293 |
| 5 | ශිතකළ දැල්ලන් | 556 | 00 |
| 6 | ලෙලි කජු | 560 | 01 |
| 7 | ධාන්‍ය වර්ග | 570 | 193 |
| 8 | හාල් | 572 | 120 |
| 9 | ශක්තිජනක පාන | 575 | 51 |
| 10 | තේකොළ | 580 | 500 |
| 11 | පාම් ඔලේන් හා පාම් ස්ටියරීන් | 750 | 54 |
| 12 | රත්‍රං | 760 | 37 |
| 13 | සකස් කරන ලද පිටි පිෂ්ඨය මෝල්ට් | 815 | 358 |
| | එකතුව | | 3,282 |

සතුන් හා සත්ත්ව නිෂ්පාදන හා විවිධ ආනයන සඳහා නිකුත් කළ බලපත්‍ර





## 2.2.6 2023 වර්ෂයේ නිකුත් කරන ලද ආනයන හා අපනයන පාලන බලපත්‍ර -මාසිකව

| මාසය | ඒකක 1 | ඒකක 2 | ඒකක 3 | ඒකක 4 | ඒකක 5 | එකතුව |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 227 | 39 | 303 | 254 | 261 | 1,084 |
| පෙබරවාරි | 197 | 34 | 343 | 255 | 195 | 1,024 |
| මාර්තු | 171 | 23 | 364 | 383 | 204 | 1,145 |
| අප්‍රේල් | 81 | 17 | 259 | 363 | 129 | 849 |
| මැයි | 138 | 24 | 347 | 382 | 225 | 1,116 |
| ජුනි | 197 | 17 | 366 | 492 | 340 | 1,412 |
| ජුලි | 155 | 39 | 344 | 480 | 437 | 1,455 |
| අගෝස්තු | 150 | 36 | 373 | 491 | 339 | 1,389 |
| සැප්තැම්බර් | 161 | 36 | 360 | 482 | 329 | 1,368 |
| ඔක්තෝබර් | 118 | 36 | 390 | 715 | 327 | 1,586 |
| නොවැම්බර් | 129 | 63 | 462 | 571 | 288 | 1,513 |
| දෙසැම්බර් | 221 | 21 | 345 | 350 | 208 | 1,145 |
| එකතුව | **1,945** | **385** | **4,256** | **5,218** | **3,282** | **15,086** |




## 2.2.7 පසුගිය වසර 5 තුළ නිකුත් කරන ලද ආනයන අපනයන පාලන බලපත්‍ර

| | අයිතමය | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|
| **ඒකක 01** | ඖෂධ | **2,489** | **2,594** | **2,255** | **1,832** | **1,945** |
| **ඒකක 02** | වාහන හා අමතර කොටස් | **518** | **197** | **284** | **647** | **385** |
| **ඒකක 03** | රසායනික ද්‍රව්‍ය හා අපනයන | **3,948** | **3,956** | **4,313** | **3,653** | **4,256** |
| **ඒකක 04** | ජංගම දුරකථන, සන්නිවේදන උපකරණ හා වෙනත් | **5,241** | **5,083** | **8,982** | **4,231** | **5,218** |
| **ඒකක 05** | සතුන්, සත්ත්ව නිෂ්පාදන හා විවිධ ආනයන | **4,888** | **4,299** | **3,742** | **3,443** | **3,282** |
| එකතුව | | **17,084** | **16,129** | **19,576** | **13,806** | **15,086** |




## 2.3 පසුගිය වසර 3 තුළ නිකුත් කරන ලද ආනයන හා අපනයන පාලන බලපත්‍ර පිළිබඳ දත්ත සමාලෝචනය

### 2.3.1 ඖෂධ සහ වෛද්‍ය උපකරණ - ඒකක 1

මූල්‍ය ද්‍රවශීලතාවය ඉහළ යෑම සහ විනිමය අනුපාතිකය අඛණ්ඩව ශක්තිමත් වීම හේතුවෙන් 2022 වසරට සාපේක්ෂව 2023 වර්ෂයේදී නව බලපත්‍ර නිකුත් කිරීම 6.2% කින් සුළු වශයෙන් ඉහළ ගොස් ඇත. ආයුර්වේද ඖෂධ කාණ්ඩය හැර බටහිර ඖෂධ, පශු ඖෂධ, හෝමියෝපති ඖෂධ සහ වෛද්‍ය උපකරණ යන අනෙකුත් සියලුම කාණ්ඩ සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කෙරේ.

2021 වර්ෂයට සාපේක්ෂව, 2022 වර්ෂයේදී නිකුත් කරන ලද නව බලපත්‍ර සංඛ්‍යාව පහත වැටුණද, 2023 වසරේ සිට ඉහළ යෑමේ ප්‍රවණතාවයත් සමඟ සාමාන්‍යකරණය වන බව පෙනේ. සමස්තයක් ලෙස ගත් කළ, ආනයනයේදී පනවා තිබූ විවිධ පාලන කොන්දේසි ලිහිල් කිරීම සහ විදේශ සංචිතවල වර්ධනය නිසා නැවැත ඖෂධ සමාගම් විසින් මෙරට ඖෂධ අවශ්‍යතාවය හිඟයකින් තොරව සපුරාලීමට පෙළඹී ඇති බව පෙනේ.

### 2.3.2 පාවිච්චි කරන ලද මෝටර් රථ සහ වාහන අමතර කොටස් - ඒකක 2

2020 වර්ෂයේදි, කොවිඩ් -19 ගෝලීය වසංගත තත්ත්වය හමුවේ විනිමය අනුපාතය මත වූ පීඩනය අවම කිරීම උදෙසා සහ දේශීය කර්මාන්ත නංවාලීම සඳහා වාහන හා අමතර කොටස් ආනයන තාවකාලිකව අත්හිටුවීමට දෙපාර්තමේන්තුව විසින් රෙගුලාසි ප්‍රකාශයට පත් කරන ලදී. ඒ හේතුවෙන් 2020 වර්ෂයට පෙර පැවති තත්ත්වයට සාපේක්ෂව මෙම ඒකකය මඟින් වාහන ආනයනය සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාවෙහි විශාල අඩුවීමක් දක්නට ඇත. රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණ අනුව 2021 වසරේ දී දේශීයව වාහන එකලස් කිරීමේ කර්මාන්ත නඟා සිටුවීම උදෙසා වාහන අමතර කොටස් ආනයනය කිරීමට බලපත්‍ර ලබා දීම සිදු විය. ඒ හේතුවෙන් 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වාහන අමතර කොටස් ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම ක්‍රමිකව වර්ධනය වී ඇත.

2022 මාර්තු මස 09 දිනැති අංක 2270/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් සහ 2022 අප්‍රේල් මස 09 දිනැති අංක 2274/42 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් වීදුරු භාණ්ඩ, ගෘහ භාණ්ඩ ඉටි පන්දම්, සනීපාරක්ෂක උපකරණ, අව් කණ්නාඩි, ඔරලෝසු, සහ සංගීත භාණ්ඩ යානාදී අයිතම බලපත්‍ර පාලනයට යටත් කිරීමත් සමග මෙම අයිතම සඳහා 2022 වර්ෂයේදී බලපත්‍ර නිකුත් කිරීමෙන් එම වර්ෂයේ ඒකක 2 මගින් නිකුත් කළ

ගැසට් පත්‍රයෙන් මෙම අයිතම බලපත්‍ර පාලනයෙන් ඉවත් කරන ලදී. තවද, 2022 අගෝස්තු මස 23 දිනැති අංක 2294/29 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් විද්‍යුත් මෝටර් බයිසිකල් සහ පා පැදි ආනයනය බලපත්‍ර පාලනයට යටත් කිරීමෙන් එම වර්ෂයේදී බලපත්‍ර ලබා ගැනීමේ ශීඝ්‍ර අඩුවීමක් දක්නට ලැබේ.

ඒ අනුව, මෙම ඒකකයෙන් නිකුත් කරන ලද මුළු බලපත්‍රවල 2020 වර්ෂයෙන් පසු ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කරන අතර 2023 වර්ෂය හා සැසඳීමේදී යම් පසුබෑමක් පෙන්නුම් කරයි.

### 2.3.3 රසායනික ද්‍රව්‍ය, පොහොර, පළිබෝධනාශක හා කාර්මික අමුද්‍රව්‍ය ආනයන හා අපනයන - ඒකක 3

ආනයනය කරනු ලබන පූර්වජ රසායනික ද්‍රව්‍ය, පෙට්‍රෝලියම් ආශ්‍රිත නිෂ්පාදන, විකිරණශීලී ද්‍රව්‍ය, මධ්‍යසාර ආශ්‍රිත අමුද්‍රව්‍ය, අනෙකුත් කර්මාන්ත සඳහා අවශ්‍ය රසායනික, වෙනත් අමුද්‍රව්‍ය ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ ලෝහ සුන්බුන් අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම ඒකක 3 මගින් සිදු කෙරේ.

ඒ අනුව 2023 වර්ෂයේ දී සියලුම කාණ්ඩ යටතේ නිකුත් කරන ලද ආනයන සහ අපනයන බලපත්‍ර සංඛ්‍යාව පසුගිය වර්ෂ තුනට සාපේක්ෂව ඉහළ ගොස් ඇත. 2020 වර්ෂයේ ඇති වූ කොවිඩ් වසංගතය හමුවේ විනිමය අනුපාතිකය මත ඇති වූ පීඩනය ක්‍රමිකව පහව යාමත් සමගම නිෂ්පාදන කර්මාන්ත ක්‍රමිකව සුපුරුදු රිද්මයට පැමිණ ඇත. එමනිසා පසුගිය වර්ෂ තුනට සාපේක්ෂව ආනයන ක්‍රමිකව ඉහළ ගොස් ඇත. එමෙන්ම, නිෂ්පාදන ක්‍රියාවලින් ඉහල යාම නිසා එමගින් ඇති වූ ලෝහ සුන්බුන් ප්‍රමාණය ද වැඩි ප්‍රමාණයක් අපනයනය කර ඇත.

### 2.3.4 ජංගම දුරකථන, සන්නිවේදන උපකරණ හා වෙනත් - ඒකක 4

දුරකථන, සන්නිවේදන උපකරණ, ඉලෙක්ට්‍රොනික උපකරණ, ලී, කීයත්, දුරස්ථ පාලක සෙල්ලම් බඩු, වෙඩි බෙහෙත්, වායු, රයිෆල් වැනි අයිතම සඳහා පාලන බලපත්‍ර නිකුත් කිරීම මෙම ඒකකය මගින් සිදුකරනු ලැබේ.

තවද, 2023 ජූනි මස 09 දිනැති අංක 2335/26 දරන අති විශේෂ ගැසට් පත්‍රය නිකුත් වීමත් සමඟ ගෙවීම් ක්‍රමවේදයන් උල්ලංඝනය වීම හේතුවෙන් ශ්‍රී ලංකා රේගුව විසින් මෙම දෙපාර්තමේන්තුව යොමු කරනු ලබන අයදුම්පත් වලට අදාළව අතිරේක ගාස්තු අයකිරීමේ කාර්යය ද මෙම ඒකකය වෙත පවරා ඇත. ඒ අනුව අයදුම්පත් 126 කට අදාළව 2023 වර්ෂයේදී අනුමැතිය ලබා දී ඇත.

### 2.3.5 සතුන්, සත්ත්ව නිෂ්පාදන හා විවිධ ආනයන - ඒකක 5

2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂය තුළ නිකුත් කර ඇති මුළු බලපත්‍ර සංඛ්‍යාව ඉහළ අගයක් පෙන්වන අතර කාණ්ඩ වශයෙන් සැලකීමේදී ඇතැම් කාණ්ඩ සඳහා බලපත්‍ර නිකුත් කිරීම ඉහළ අගයක් පෙන්වුවද, ඇතැම් කාණ්ඩ සඳහා නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව 2022 වර්ෂය හා සැසඳීමේදී අඩු අගයක් ගනී.

2022 දෙසැම්බර් මස 09 දිනැති අංක 2309/40 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සහල් ආනයන බලපත්‍ර පාලනයට යටත් කිරීම සමඟ එම ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාරව ආනයනය සඳහා අවසර ලැබුණු සහල් තොග රේගු නිෂ්කාශනය සඳහා 2022.12.31 දින වන විට ආනයන පාලන බලපත්‍ර 86 ක් නිකුත් කරන ලද අතර, 2023 වර්ෂයේදීද එම ගැසට් නිවේදනයට අනුව බලපත්‍ර නිකුත් කිරීම සිදු කරන ලදී

ආනයනය තාවකාලිකව අත්හිටුවා තිබූ කජු , උඳු පිටි, රටකජු අංක 2553/16 හා 2023.10.09 දිනැති අති විශේෂ ගැසට්පත්‍රය මගින් බලපත්‍ර පාලනයට යටත් කිරීම හේතුවෙන් එම අයිතම සඳහා බලපත්‍ර නිකුත් කිරීම ආරම්භ කරන ලදී. එබැවින් 570 කාණ්ඩය යටතේ නිකුත් කරන ලද බලපත්‍ර ප්‍රමාණය 2022 වසරට සාපේක්ෂව වර්ධනයක් පෙන්නුම් කරයි.

අංක 2336/45 හා 2023.06.14 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව තිරිඟු පිටි ආනයන පාලනයට යටත් කළ අතර ඒ අනුව තිරිඟු පිටි සඳහා ආනයන පාලන බලපත්‍ර 358 ක් 2023 වර්ෂය සඳහා නිකුත් කර ඇත.

ධීවර කර්මාන්තයේ දී භාවිත කරනු ලබන ඇම වශයෙන් යොදා ගන්නා දැල්ලන් සඳහා කෘත්‍රිම ආදේශකයක් මේ වන විට ප්‍රචලිත වී බැවින් 556 කාණ්ඩය යටතේ frozen squid ආනයනය කිරීම, පෙර වර්ෂවල අනුක්‍රමික ලෙස අඩුවී ගොස් ඇති අතර, 2023 වර්ෂයේ කිසිදු ආනයනය කිරීමක් සිදුකර නොමැත.

අංක 2274/42 හා 2022.04.09 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයෙන් බලපත්‍ර පාලනයට යටත් කරන ලද කාණ්ඩ 14කට අදාළ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ රැසක් අංක 2282/21 හා 2022.05.31 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මඟින් බලපත්‍ර පාලනයෙන් ඉවත් කිරීම හේතුවෙන් 2023 වර්ෂය තුළදී එම කිසිදු කාණ්ඩයක් යටතේ බලපත්‍ර නිකුත් කිරීමක් සිදු නොවුණි.

පසුගිය වර්ෂයන්ට සාපේක්ෂව රටෙහි විදේශ විනිමය ඉහළ යාම හේතුවෙන් ඇතැම් කාණ්ඩ යටතේ සිදු වූ ආනයනයන් ඉහළ යාමට හේතු වී ඇති බව නිරීක්ෂණය වේ.

## 2.4 ආනයන හා අපනයන ගෙවීම් ක්‍රම සහ නියෝග

වාණිජ අරමුණින් සිදුකරනු ලබන ජාත්‍යන්තර වෙළඳ ගනුදෙනු නියාමනය කිරීමද දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. ඒ වෙනුවෙන් විදේශ වෙළඳ ගෙවීම් ක්‍රම අංක 1739/03 හා .2012.01.02 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධියට පත්කර ඇති අතර, එම ගෙවීම් ක්‍රම පහත සඳහන් වේ. තවද, මෙම ගෙවීම් ක්‍රම සම්බන්ධයෙන් වාණිජ බැංකු වෙත මෙහෙයුම් උපදෙස් නිරන්තරයෙන් නිකුත් කරනු ලැබේ.

1. පෙර ගෙවීම් (**Advanced Payments)**
2. පිළිගැනීම මත ලේඛන (**Documents against Acceptance - DA)**
3. ණයවර ලිපි (**Letters of Credit - LC)**
4. ගෙවීම් මත ලේඛන (**Documents against Payment)**
5. විවෘත ගිණුම් (**Open Accounts - OA)**
6. භාණ්ඩ විකුණන මුදල් ගෙවීමේ පදනම (**Payments on Consignment** Account **Basis)**

ඉහත සඳහන් ගෙවීම් ක්‍රමවලට අදාළ රෙගුලාසිවලට අනුකූල වන ලෙස භාණ්ඩ ආනයනය කර නොමැති අවස්ථාවලදී හෝ ගෙවීම් කර නොමැති විට දී එම භාණ්ඩ ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කිරීමට පෙර සහ ආනයනයට අදාළ ගෙවීම් කිරීම හා ඊට අදාළ කරුණු සැලකිල්ලට ගෙන ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දෙනු ලැබේ. ඒ අනුව, එලෙස 2023 වර්ෂයේ දී ලබාදුන් අනුමැතීන් පහත පරිදි වේ.

| 2023 වර්ෂයේ දී ඒකක 02 මඟින් ලබාදෙන ලද අනුමැතීන් | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| මාසය | අනුමැතීන් වර්ග | | | | | | | |
| | පෙර ගෙවීම | සුළුගැනීම මත ලේඛන සඳහා බදු ගෙවීම | බිඩෑන ශිඥුම මත ගෙවීම | ප්‍රති අපනයන | ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි කර්මාන්ත වලින් ඉවතලන ද්‍රව්‍ය දේශීය වෙළෙඳපොළට නිකුත් කිරීම | විද්‍යුත් ප්‍රේෂණ සහ ණයවර ලිපි මත ගෙවීම | වෙනත් | මුළු එකතුව |
| ජනවාරි | 23 | 84 | 88 | 03 | 03 | 148 | 01 | 350 |
| පෙබරවාරි | 07 | 100 | 98 | 05 | 04 | 107 | 04 | 325 |
| මාර්තු | 17 | 108 | 196 | 03 | 02 | 172 | 01 | 499 |
| අප්‍රේල් | 04 | 66 | 139 | 07 | 0 | 95 | 08 | 319 |
| මැයි | 14 | 89 | 219 | 0 | 02 | 170 | 06 | 500 |
| ජූනි | 09 | 101 | 207 | 04 | 03 | 117 | 10 | 451 |
| ජූලි | 07 | 52 | 117 | 02 | 01 | 129 | 06 | 314 |
| අගෝස්තු | 07 | 42 | 81 | 01 | 05 | 102 | 03 | 241 |
| සැප්තැම්බර් | 05 | 48 | 72 | 02 | 00 | 97 | 02 | 226 |
| ඔක්තොම්බර් | 06 | 58 | 97 | 01 | 03 | 105 | 05 | 275 |
| නොවැම්බර් | 09 | 43 | 95 | 04 | 05 | 37 | 03 | 196 |
| දෙසැම්බර් | 11 | 33 | 67 | 03 | 03 | 42 | 08 | 167 |
| **මුළු එකතුව** | **119** | **824** | **1,476** | **35** | **31** | **1,321** | **57** | 3,863 |

## 2.5. ශ්‍රී ලංකාවේ ආනයන හා අපනයන නියාමනය හා පහසුකරණය

### 2.5.1 ආනයන (ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලන) නියෝග

උසස් ප්‍රමිතියකින් හා ඉහළ ගුණාත්මකභාවයකින් යුක්ත ආනයනික භාණ්ඩ භාවිත කිරීමට රටේ පාරිභෝගිකයින්ට අවස්ථාව ලබා දීම සඳහා ආනයනික භාණ්ඩ ශ්‍රී ලංකා ප්‍රමිතීන්ට අනුකූල වීම අනිවාර්ය කරමින් හා යාවත්කාලීන කෙරෙන ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලන රෙගුලාසි කලින් කලට නිකුත් කරනු ලැබේ. ඒ අනුව, දැනට ක්‍රියාත්මකව පවතින 2018 මාර්තු මස 29 දිනැති අංක 2064/34 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කරන ලද ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලන රෙගුලාසි සංශෝධනය කිරීමේ අවශ්‍යතාව දෙපාර්තමේන්තුව විසින් හඳුනාගනිමින් ඒ සඳහා අදාළ ක්‍රියාමාර්ගවලට 2023 වර්ෂයේ දී අවතීර්ණ විය.

එලෙස ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලයන්ට අනුකූල විය යුතු නව ආනයනික අයිතම හඳුනා ගැනීමට පාර්ශ්වයන්ගේ අදහස් හා යෝජනාව ලබා ගන්නා ලදී. ඒ අනුව, ඉදිරිපත් වී ඇති සියලු යෝජනා ගැසට් නිවේදනයේ ඇතුළත් කිරීම සඳහා ඇති හැකියාව පිළිබඳව අදාළ රාජ්‍ය ආයතන, වාණිජ මණ්ඩල හා වාණිජ බැංකු සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගැසට් නිවේදනය කෙටුම්පත් කිරීමේ කටයුතු 2023 වර්ෂයේ දී අවසන් කර ඇති අතර, 2024 වර්ෂයේ දී එය ප්‍රකාශයට පත්කිරීමට කටයුතු සැලසුම් කර ඇත.

### 2.5.2 එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ 1540 දරන යෝජනාව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම

න්‍යෂ්ටික, රසායනික, ජීව විද්‍යාත්මක අවි සහ ඒවා ඉලක්කගත කරන ක්‍රම ව්‍යාප්ත වීම අන්තර්ජාතික සාමයට තර්ජනයක් වන බැවින්, එම අවි අත්පත් කර ගැනීම, සන්තකයේ තබා ගැනීම සහ ලබා දීම, ප්‍රවාහනය සහ භාවිතය සඳහා රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ට සහයෝගය ලබා දීම වැළැක්විය යුතු ය. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ 1540 යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා රෙගුලාසි පැනවීම මඟින් න්‍යෂ්ටික, රසායනික සහ ජීව විද්‍යාත්මක අවි ආශ්‍රිත ද්‍රව්‍ය සාමකාමී අරමුණු වෙනුවෙන් අපනයනය, ප්‍රති-අපනයනය, සංක්‍රමණය කිරීම (Transit) සහ නැව් මාරු කිරීම (Trans -shipment) අදාළ නීති අනුව, සිදුවිය යුතු බව දැක්වේ. එහෙත්, එම කරුණු ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් පරිදි නීති සම්පාදනය වී නොමැති බැවින්, ශ්‍රී ලංකාව විසින් ද මෙම උපායමාර්ගික භාණ්ඩ අපනයනය සම්බන්ධයෙන් මනාව සැලසුම්කරණය කළ නීතිමය රාමුවක් සකස් කළ යුතුව ඇත. මෙලෙස අන්තර්ජාතික සම්මුතියක් ක්‍රියාත්මක කිරීම තුළින් මෙරටෙහි වගකීමක් හා වගවීමක් නිරූපණය වන අතර, එමගින් ප්‍රතිලාභ රැසක් ශ්‍රී ලංකාවට අත් වනු ඇත.

ඉහත අවශ්‍යතාවන්ට අනුගතව 1540 දරන යෝජනාව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා 2019 සැප්තැම්බර් මස 11 වන දින අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය එකඟතාව ලැබී ඇත. එසේම, එම යෝජනාව ඵලදායීව ක්‍රියාත්මක කිරීම හා අවශ්‍ය නීතිමය හා තාක්ෂණික සහාය ලබා දීම සඳහා නීති සම්පාදන කමිටුව සහ තාක්ෂණ කමිටුව වශයෙන් රාජ්‍ය ආයතනවලින් සැදුම්ලත් කමිටු ද්විත්වයක් අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් පත් කර ඇත. එම තාක්ෂණික කමිටුව විසින් යුරෝපා සංගම් යුධ උපකරණ ලැයිස්තුව (EU Military list) සහ යුරෝපා සංගම් ද්වි භාවිත පාලන ලැයිස්තුව (EU Dual – Use Control List) ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ යන භාෂාත්‍රයෙන් පිළියෙල කර ඇත.

එහෙත්, දැනට මේ සඳහා ලබා දී ඇති අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2019 දී බැවින් එය කල්ගත වූ තීරණයක් නිසාවෙනි. ඒ සඳහා වර්තමාන අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය එකඟතාව ලබා ගැනීම සුදුසු බවට නීති කෙටුම්පත් සම්පාදක විසින් 2023.03.08 දිනැතිව අදහස් දක්වා තිබුණි. ඒ අනුව සකස් කළ නව අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

තවද එම යෝජනාව ක්‍රියාත්මක කිරීමට විධිවිධාන සැලසීම සඳහා උපායමාර්ගික වෙළෙඳ කළමනාකරණ පනත (Strategic Trade Management Act) කෙටුම්පත් කර ඇත. මෙහිදී 1540 දරන යෝජනාව ශ්‍රී ලංකාව තුළ වඩාත් ඵලදායී ව ක්‍රියාත්මක කිරීම සඳහා පත් කළ නීති සම්පාදන කමිටුවේ, එක්සත් ජාතීන්ගේ 1540 වන යෝජනාව සම්බන්ධයෙන් කටයුතු කරන විෂයය විශේෂඥයන්ගේ නිරීක්ෂණ මෙන් ම, ආසියා ශාන්තිකර කලාපයේ රටවල දැනට ක්‍රියාත්මක වන උපායමාර්ගික වෙළෙඳ කළමනාකරණ පනත් ද අධ්‍යයනය කර සකස් කරන ලද මෙම පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත. ඒ පිළිබඳ නීති කෙටුම්පත් සම්පාදකගේ නිරීක්ෂණ මත පදනම් ව ඉදිරි ක්‍රියාමාර්ග සඳහා යොමු වීමට නියමිත ය.

### 2.5.3 පූර්ව නැව්ගත කිරීමේ පරීක්ෂණ සහතිකය (Pre-Shipment Inspection Certificate)

පාවිච්චි කළ වාහන ශ්‍රී ලංකාවට ආනයනය කිරීමේදී එම වාහන නියමිත වායු විමෝචන ප්‍රමිතීන් සහ ආරක්ෂක මිනුම් ප්‍රමිතිවලට අනුකූල ද යන්න පරීක්ෂා කළ යුතු බැවින්, ඒ සඳහා පූර්ව නැව්ගත කිරීමේ පරීක්ෂණ සහතිකය ලබාගත යුතු බලයලත් පරීක්ෂණ ආයතන ඇතුළත් කර 2013 අප්‍රේල් මස 04 දිනැති අංක 1804/17 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කර තිබේ.

එම ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කරන ලද පරීක්ෂණ ආයතන මඟින් පමණක් පූර්ව නැව්ගත කිරීමේ පරීක්ෂණ සහතිකය ලබාගත යුතු වීම මත ඒකරාශී වී ඇති ඒකාධිකාරය හේතුවෙන් සේවා සැපයීමේ දී ඇතිවන දුෂ්කරතාවයන් සැලකිල්ලට ගෙන තම සේවාලාභීන් වෙත වඩා කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ලබාදීමේ අරමුණින් බලයලත් පරීක්ෂණ ආයතන සංඛ්‍යාව වැඩිකිරීමේ අවශ්‍යතාවය මතු විය. ඒ අනුව, තාක්ෂණික ඇගයුම් කමිටුවක් හරහා එම කාර්යය සිදුකිරීමට දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය කටයුතු සලසා ඇත.

මේවන විට බලයලත් පරීක්ෂණ ආයතන සංඛ්‍යාව වැඩිකිරීම සඳහා අවශ්‍ය ගැසට් නිවේදනය කෙටුම්පත් කර ඇති අතර, බලයලත් පරීක්ෂණ ආයතන කිහිපයක් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම සඳහා තවදුරටත් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සමග සම්බන්ධීකරණ වෙමින් ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

ඒ අනුව, මෙම ගැසට් නිවේදනය ප්‍රකාශයට පත්කිරීම තුළින් ඉදිරියේදී ආනයනකරුවන්ට වාහන ආනයනයේ දී මුහුණපෑමට සිදුවන දුෂ්කරතා අවම කරගැනීමට හා ඒවා මිලදී ගන්නා පාරිභෝගිකයන්ගේ ආරක්ෂාව තහවුරු කරගැනීමට ඉඩකඩ සැලසෙනු ඇත.

### 2.5.4. ආනයන පාලන රෙගුලාසි උල්ලංඝනය කරනු ලබන ආනයන කරුවන්ගේ නාම ලේඛනය ප්‍රසිද්ධ කිරීමේ ගැසට් නිවේදනය (Blacklist)

ආනයන හා අපනයන පාලන රෙගුලාසි මඟින් නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකූල නොවන ආනයනයන් සිදු කරන ආනයනකරුවන්ගේ ලේඛනය ප්‍රසිද්ධ කිරීම, ජාතික ආර්ථිකය, මහජන සෞඛ්‍ය හා ආරක්ෂාව මෙන්ම පාරිසරික සුරක්ෂිතතාව තහවුරු කිරීමේ සමාජ වගකීම ඉටු කිරීමේ දර්ශකයකි. එබැවින් ආනයන හා අපනයන පාලන රෙගුලාසි මඟින් නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකූල නොවන ආනයනයන් සිදු කරන ආනයනකරුවන්ගේ ලේඛනය ප්‍රසිද්ධ කිරීමට අදාළ විධිවිධාන මේ යටතේ සලසා ඇත.

ඊට අදාළ ක්‍රමවේදයන් ඇතුළත් කර රෙගුලාසි භාෂාත්‍රයෙන්ම සකස් කර නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කර ඇති අතර, අවශ්‍ය සංශෝධන සිදු කිරීමෙන් අනතුරුව එම රෙගුලාසි සහිත කෙටුම්පත නීතිපතිතුමාගේ නිරීක්ෂණ හා උපදෙස් ලබා ගැනීමෙන් පසු කඩිනමින් ගැසට් නිවේදනයක් මඟින් ප්‍රසිද්ධ කටයුතු යොදන ලදී.

### 2.5.5. ආනයන හා අපනයන අනුමැතීන් ලබාදීමේදී නිර්දේශ ලබාදිය යුතු නව ආකෘතියක් හඳුන්වාදීම (Recommending Authorities)

ආනයන පාලන බලපත්‍ර ලබාදීම සඳහා විවිධ ආයතනවලින් නිකුත් කරනු ලබන නිර්දේශ ලබා ගැනීම වඩාත් ක්‍රමවත් කිරීම සඳහා නව ආකෘතියක් හඳුන්වා දෙන ලද අතර, බලපත්‍රයක් ලබාදීම සඳහා අදාළ නිර්දේශ ලබාදෙන ආයතනය විසින් ආනයනය කරනු ලබන භාණ්ඩවල ප්‍රමාණය, ගුණාත්මකභාවය, සැපයුම්කරු පිළිබඳ තොරතුරු ආදී වැදගත් දෑ ඇතුළත් වන පරිදි එම ආකෘතිය සකස් කර ඇත. එම ආකෘතිය නිකුත් කිරීම සියලුම බලපත්‍ර සඳහා නිර්දේශ ලබාදෙන ආයතනවලට හඳුන්වා දුන් අතර, යෝජිත නව පරිගණක මෘදුකාංග පද්ධතිය හරහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය සඳහාද භාවිතා කළ හැකිවන පරිදි මෙය සකස් කර ඇත.

ආනයන පාලන බලපත්‍ර ලබාදීමේ දී සළකා බලනු ලබන අදාළ නිර්දේශය ලබාදෙන ආයතනය විසින් යම් භාණ්ඩයක් ගෙන්වීම සම්බන්ධයෙන් ඔවුන්ගේ විරුද්ධත්වයක් නොමැති බවට දන්වන ලද ලිපි ඉදිරිපත් කිරීමේ ප්‍රවණතාවයක් තිබුණද, නව ආකෘති පත්‍රය හරහා එම ක්‍රියාපිළිවෙළ වෙනස් කරන ලද අතර, පැහැදිළිවම අදාළ භාණ්ඩ ගෙන්වීම සඳහා එම ආයතනයේ නිර්දේශය ලබාගැනීම සිදුකිරීම 2023 වර්ෂයේදී දියත් කළ එක් සාධනීය වැඩකටයුත්තකි.

එසේම, බලපත්‍ර නිකුත් කිරීමේ දී ඒ ඒ අයිතමයට අනුකූලව විශේෂිත කොන්දේසි පැනවීම මඟින් ආනයන පාලනය විධිමත් කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව, බලපත්‍ර නිකුත් කිරීම ප්‍රමිතිකරණය කිරීමේ කටයුතු සිදු කෙරිණි.

### 2.5.6. ආනයන හා අපනයන බලපත්‍ර කොන්දේසි සමාලෝචනය හා විධිමත් කිරීම

දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ආනයන හා අපනයන පාලන බලපත්‍රය සඳහා ඇතුළත් කළ යුතු කොන්දේසි සමාලෝචනයන් සිදුකළ අතර, එහි දී සියලුම අංශ සඳහා වන පොදු කොන්දේසි, එක් එක් අංශ සඳහා පමණක් අදාළ වන කොන්දේසි හා යම් අයිතමයකට හෝ කිසියම් අවස්ථානුකූලව යෙදිය යුතු සුවිශේෂී කොන්දේසි ලෙස වර්ගීකරණයන් යටතේ හඳුනා ගන්නා ලද අතර, ඒ අනුව සියලුම අංශවලට අදාළ බලපත්‍ර කොන්දේසි විධිමත් කිරීමට කටයුතු කරමින් පවතී.

### 2.5.7 ආනයන හා අපනයන බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රතිපත්තිමය රාමුවක් සකස් කිරීම

මෙම දෙපාර්තමේන්තුව විසින් දැනට බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය තවදුරටත් දෙපාර්තමේන්තුවේ ඉලක්ක ගත අරමුණු වෙත ඍජුවම කේන්ද්‍රගත කිරීම හා සේවාලාභීන් වෙත විනිවිදභාවයෙන් යුතුව සිය සේවාවන් ලබා ගැනීම සඳහා ඉඩ සැළසීම පිණිස දැනට දෙපාර්තමේන්තුව තුළ බලපත්‍ර නිකුත් කිරීමේ දී පාදක කර ගන්නා ක්‍රමවේදය සමාලෝචනය කිරීමට මූලික පියවර සකස් කර ඇත. එසේම බලපත්‍ර පාලනයට යටත් කර ඇති සියලුම අයිතමයන් තහනම්, තාවකාලික තහනම්, බලපත්‍ර නිකුත් කිරීමේ තාවකාලික අත්හිටුවීම් හා සමාන්‍ය පරිදි බලපත්‍ර නිකුත් කිරීම් යටතේ වර්ගීකරණය කොට අදාළ නිර්දේශ ඉදිරිපත් කරනු ලබන ආයතන තවදුරත් නිශ්චය කිරීමෙන් අනතුරුව ඒවා ගැසට් පත්‍ර මඟින් ප්‍රකාශයට පත් කිරීමට සැළසුම් කර ඇත.

### 2.5.8 අංශ අතර ඒකමිතිය පවත්වා ගැනීම උදෙසා අභ්‍යන්තර පුහුණු සැසි සංවිධානය

මෙම දෙපාර්තමේන්තුව තුළ ඒකක 5 ක් යටතේ ආනයන හා අපනයන බලපත්‍ර නිකුත් කරනු ලබන අතර, එහිදී එක් එක් අංශවලට අනන්‍ය වූ තත්ත්වයන් මෙන්ම සියලුම අංශවලට පොදු වූ අයදුම්පත් ඉදිරිපත් කිරීම, අයදුම්පත් පිළිගැනීම, අයදුම්පත් පරික්ෂා කිරීම, අයදුම්පත් අනුමත කිරීම, ගෙවීම් හා බලපත්‍ර නිකුත් කිරීම මෙන්ම බලපත්‍ර හර කිරීම් හා එහිදී වන ගාස්තු හා අතිරේක ගාස්තු ගණනයන් ද හඳුනා ගත හැකි වේ. මෙම පොදු අංගයක් අතර, ඒකමිතිය පවත්වා ගැනීම සඳහා අනන්‍ය වූ අංශ පිළිබඳව තවදුරටත් දැනුම්වත්වීම සඳහාත් අභ්‍යන්තරව දැනුම් හුවමාරුව හා දැනුම් ලබාදීමේ වැඩමුළු පවත්වන ලදී.

### 2.5.9 තොරතුරු තාක්ෂණ අංශය ශක්තිමත් කිරීම

මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සේවාලාභීන් වෙත සේවා සැළසීම උදෙසා ස්ථාපිත කොට අවසන් කිරීමට අපේක්ෂිත STRATLINK පද්ධතිය සාර්ථක කර ගැනීමට ඉලක්කකර ගනිමින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පාලක තනතුරක් ඇති කිරීම සහ තොරතුරු තාක්ෂණ අංශයට සුදුසුකම් සහිත ප්‍රමාණවත් නිලධාරීන් බඳවා ගැනීම සහ තෝරාගත් නිලධාරීන් වෙත තොරුතුරු තාක්ෂණය පිළිබඳ විශේෂ පුහුණු ලබාදීම.

### 2.5.10 . දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය ඉහළ නැංවීම උදෙසා එක් එක් අංශවල කාර්ය සාධනය,

හඳුන්වා දෙන ලද කාර්ය සාධනක දර්ශක ඔස්සේ විධිමත් කාල සටහනක් අනුව සංඛ්‍යාත්මක ඇගැයීමකට ලක්කිරීම හා අඩුපාඩු හඳුනාගනිමින් ඒවා නිවැරදි කිරීමට ක්‍රමවේද හඳුන්වා දීම.

## 2. 6 නව වැඩිදියුණු කිරීම්

### 2.6.1 සේවා කවුළුව හා කාර්යාල පහසුකම්

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කරන ලද රෙගුලාසි ප්‍රකාරව ආනයන පාලනයට යටත් කරන ලද අයිතම සඳහා බලපත්‍ර ඉල්ලුම් කිරීම සඳහා මෙන්ම, එලෙස නිකුත් කරන ලද බලපත්‍රවලට අදාළව මෙරටට ආනයනය කරනු ලැබූ භාණ්ඩ තොග රේගුවෙන් නිදහස් කිරීමට මත්තෙන් හර කිරීමේ කාර්යය සඳහා වාප්පු ලිපිකරුවන් සහ වෙනත් විවිධ පාර්ශ්වයන්ගෙන් සමන්විත විශාල සේවාදායක පිරිසක් මෙම දෙපාර්තමේන්තුව වෙත දෛනිකව පැමිණෙනු ලබයි.

එලෙස පැමිණෙන සේවා දායකයින් වෙත ගුණාත්මක සේවාවක් ලබාදීම කෙරෙහි අප දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂයේදී වැඩි අවධානය යොමු කරනු ලැබීය. ඒ සඳහා දෙපාර්තමේන්තු පරිශ්‍රය තුළ ඉඩපහසුකම්ද ප්‍රමාණවත් නොවීම නිසා, දෙපාර්තමේන්තුව විසින් කුලී පදනම මත මිලදී ගෙන තිබූ හේමාස් ගොඩනැගිල්ලේ බිම් මහල සේවාදායකයින්ගේ අවශ්‍යතා වෙනුවෙන් වෙන් කරන ලදී. එහිදී ඕනෑම සේවාලාභී පාර්ශ්වයකට පැමිණ ඔවුන්ට අදාළ වන කාර්යයන් ඉටුකර ගැනීමට හැකිවන සේ වෙන් වෙන් වශයෙන් හඳුනාගත් විෂයන් යටතේ සේවා කවුළු 05 ක් ස්ථාපනය කරන ලදී. ඒ ඔස්සේ අපගේ සේවාව වඩාත් ඉහළ ගුණාත්මකභාවයකින් යුතුව ලබාදීමටත්, සේවාදායකයෙකු විසින් දෙපාර්තමේන්තුවෙන් ඉටුකර ගන්නා සේවාවට අදාළව රැඳීසිටිය යුතු කාලය අවම කිරීමටත් එමඟින් හැකියාව ලැබී ඇත.

තවද, සේවාදායකයින්ගේ ගැටලු සඳහා එසැණින් ප්‍රතිචාර දැක්වීම සේවා කවුළුවල යොදවා ඇති නිලධාරීන් හරහා කටයුතු කරන ලදී. එබැවින් මනා සුහදශීලි කාර්යක්ෂම සේවාවක් මහජනතාව වෙත ලබාදීමට හැකියාව ලැබීම සතුටට කරුණකි. ඒ අනුව සේවා කවුළු ක්‍රමය හුදෙක් සේවා දායකයින්ගේ පහසුව වෙනුවෙන්ම ස්ථාපිත කරන ලද්දක් වන අතර, දෙපාර්තමේන්තුවේ ඒකක, අංශවලට ස්වකීය රාජකාරිය පහසුවෙන් ඉටුකරලීමට එය මහත් රුකුලක් විය. තවද අයදුම්පත් ඉදිරිපත් කිරීමට පහසු කිරීම පිණිස භාෂාත්‍රයෙන්ම සකස් කරන ලද ආදර්ශ අයදුම්පත් හා ඊට අදාළ උපදෙස් පත්‍රිකා ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන ලදී. එසේම යම් පුද්ගලයෙකු පිටරටක සිට මෙරටට භාණ්ඩයක් රැගෙන ඒමේ දී ආනයනය සම්බන්ධයෙන් කටයුතු කළ යුතු සාමාන්‍ය ක්‍රියා පිළිවෙත සකස් කොට ප්‍රදර්ශනය කිරීමට මූලික පියවර ගෙන ඇත.

### 2.6.2 ලේඛනාගාරය

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තු පරිශ්‍රය සීමාසහිත ඉඩකඩ ප්‍රමාණයක පැවතීම නිසා වැඩ අවසන් කළ ලිපිගොනු විධිමත්ව ගබඩාකර ගැනීමේ පහසුකම් අවම වීම තුළ දෙපාර්තමේන්තුවට විධිමත් ලේඛනාගාරයක අවශ්‍යතාවය දැඩිව ඉස්මතු වී තිබුණි

ආනයන හෝ අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීමට අදාළවන ලිපිගොනු විශාල ප්‍රමාණයක් වාර්ෂිකව එකතු වේ. එම ලිපිගොනු 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ රෙගුලාසි ප්‍රකාරව සුරක්ෂිතව තබා ගත යුතු බැවින්, විශාල ඉඩකඩ ප්‍රමාණයක ලේඛනාගාරයක් අවශ්‍ය වේ.

එබැවින්, දෙපාර්තමේන්තුව සඳහා හේමාස් ගොඩනැගිල්ලේ බිම් මහල කුලී පදනම මත මිලදී ගැනීමෙන් පසු නව ලේඛනාගාරය සඳහා පහසුකම් සකස්කර ගන්නා ලදී. ඒ සඳහා ලේඛනාගාර කටයුතු පිළිබඳ හසළ අත්දැකීම් හා පළපුරුද්ද ඇති නිලධාරියෙකුද පත්කරන ලද අතර, දෙපාර්තමේන්තුව සතුව තිබූ සියලු ආරක්ෂා කළ යුතු ලේඛන පිළිබඳ සොයා බලා ලේඛනාගාර ගත කිරීමේ කටයුතු අධීක්ෂණය සඳහා මාණ්ඩලික නිලධාරීන් ඇතුළත්ව කමිටුවක් පත් කරන ලදී.

ඒ අනුව, 2023 වර්ෂයේ අවසානය වනවිට සුපිළිවෙළින් යුතු, ප්‍රමිතිගත, සුවිගතකරණය වූ විධිමත් ලේඛනාගාරයක් දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කරගෙන පවත්වාගෙන යනු ලැබේ.

## 2.7. ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කිරීමට නියමිත STRATLINK පරිගණක මෘදුකාංග පද්ධතිය

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ පවතින සේවාවන් පාරිභෝගිකයා වෙත වඩාත් කාර්යක්ෂම හා සඵලදායි ලෙස ඉටු කිරීම වස් ස්ථාපනය කිරීමට නියමිත STRATLINK පරිගණක මෘදුකාංග පද්ධතිය 2023 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ඉල්ලීම පරිදි විද්‍යුත් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලයේ අංක 1540 දරන යෝජනාවේ අවශ්‍යතාවය සපුරාලීම සඳහා ආධාර සැපයීම අරමුණු කොටගෙන, එක්සත් ජනපද තානාපති කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන අපනයන පාලන හා ආශ්‍රිත දේශසීමා ආරක්ෂක කාර්යාංශය (EXBS වැඩසටහන) විසින් පරිත්‍යාගයක් ලෙස අවශ්‍ය දෘඩාංග සහිත මෘදුකාංගයක් ලබා දීමට එකඟ විය. ඒ සඳහා මුදල් අමාත්‍යතුමා විසින් මෙම පරිගණක පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනා ඇතුළත් අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා, අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක අමප/23/0077/604/004 හා 2023.01.31 දිනැති ලිපියෙන් අනුමැතිය ලබා දී ඇත.

එම පද්ධතිය සම්බන්ධව ඉදිරිපත් කළ අංක MF/IED/17/CM/2022/233 හා 2022.12.31 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් පහත සඳහන් යෝජනා සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

1. ඇමරිකා එක්සත් ජනපදයේ EXBS වැඩසටහන මගින් ප්‍රදානයක් ලෙස ලබාදෙන යෝජිත බලපත්‍ර නිකුත් කිරීමේ මෘදුකාංග පද්ධතිය හා දෘඩාංග පිළිගැනීම.
2. ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ යෝජිත අභිරුචිකරණය කළ STRATLINK විද්‍යුත් බලපත්‍ර පද්ධතිය ක්‍රියාත්මක කිරීම.
3. වත්කම් ගිණුම්ගත කිරීම සඳහා මූල්‍ය කේතය 13 යටතේ 2023 හෝ 2024 වර්ෂයේදී මිලියන 110 ක අයවැය ප්‍රතිපාදන ගිණුම්කරණ කටයුතු සඳහා ලබාගෙන ඉන්වෙන්ට්‍රිගත කිරීම.
4. ආනයන බලපත්‍ර නිකුත් කිරීමේදී නිර්දේශ ලබාදෙන අධිකාරී සහ පාර්ශවකරුවන් අන්තර්ජාලය හරහා පද්ධතියට සම්බන්ධකොට ගෙන පද්ධතිය හරහා තොරතුරු හා දත්ත හුවමාරු කිරීම සහ
5. තොරතුරු තාක්ෂණ අංශය ශක්තිමත් කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාවට ඕනෑම දීපව්‍යාප්ත සේවක නිලධාරීන් සඳහා විවෘතව ඇති පාලක (ICT) තනතුරක් ඇති කිරීම.

තවද, මෙම පද්ධතිය භාවිතයෙන් විද්‍යුත් ආනයන හා අපනයන පාලන බලපත්‍රයක් ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව විසින් යෝජනා කර ඇත. ඒ සඳහා ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA), විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ (ERD) සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ එකඟතාවයත් මේ වන විට ලැබී ඇත.

මෙම STRATLINK පද්ධතිය ස්ථාපිත කිරීමේ කටයුතු 2023 අප්‍රේල් මාසයේ 24 වන දින ආරම්භ කරන ලද අතර, පද්ධතියේ සංවර්ධන කටයුතු පියවර කිහිපයක් ඔසසේ සිදු කරමින් 2024 මාර්තු මාසයේ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකසා ඇත.

2023 දෙවන කාර්තුවේ මුල් මාසය තුළ ආරම්භ කළ STRATLINK පද්ධතිය ස්ථාපිත කිරීමේ ක්‍රියාවලියේ දී එහි ආදර්ශ පද්ධතිය (Prototype Version) 2023 වර්ෂයේ අවසාන වන විටදී සම්පත් දායකයින් අප වෙත ඉදිරිපත් කරන ලදී. එහි පවතින විවිධ අසම්පූර්ණ සහ තවදුරටත් එක්විය යුතු අංග පිළිබඳව දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ඒකකවල පාලකවරුන් හා නිලධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුව විසින් හඳුනාගෙන මේවන විටත් පද්ධති නිර්මාණකරුවන් දැනුම්වත් කර ඇත. අපගේ අවශ්‍යතාවයන්ට ගැළපෙන අයුරින් සහ පරිශීලකයන්ට සෑම ආකාරයකින්ම පහසු සහ සුගම ක්‍රියාදාමයක් මගින් ස්වකීය අවශ්‍යතාවයන්

ඉවුකර ගැනීමට හැකිවන පරිදි මෙම පද්ධතිය වැඩිදියුණු කරගත යුතුව පවතී. එබැවින් දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ ඒකකයෙහි කාර්ය මණ්ඩලයේ සංයුතිය ද වැඩිකරගෙන ඔවුන්ගේ නිරන්තර අවධානනය මේ කෙරෙහි යොමු කරවමින් ඉදිරි වැඩ සැලසුම් දියත් කරමින් පවතී.

දෙපාර්තමේන්තුවේ සේවාදායකයන් ලෙස යම් ආයතනයක් විසින් මෙම පද්ධතිය තුළ ලියාපදිංචි වීම ප්‍රථමයෙන්ම සිදුකළ යුතුය. එලෙස ලියාපදිංචි වන සමාගමක නිත්‍යානුකූලතාවය සමාගම් ලියාපදිංචි දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය හරහාද, පෞද්ගලික ආනයනකරුවෙකුගේ නිත්‍යානුකූලභාවය පිළිබඳව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු දත්ත පද්ධතිය හරහාද තහවුරු කරගැනීමට ඇති අවකාශය පිළිබඳ දැනටමත් එම ආයතන සමඟ අප විසින් සාකච්ඡා පවත්වා ඇත. එසේම, බලපත්‍ර ගාස්තු හා අතිරේක ගාස්තු ගෙවීම්, රාජ්‍ය ගෙවීම් ජාලය (Lanka Pay (Pvt) Ltd) හරහා සිදුකිරීමේ ක්‍රමවේදයට නව පරිගණක පද්ධතිය තුළ පහසුකම් සැලසීම සඳහා සාකච්ඡා කර මේ වන විට එම වැඩිදියුණු කිරීම් ද ඇතුළත් කරන ලෙස නිර්මාණකරුවන්ව දැනුම්වත් කර ඇත.

එමෙන්ම, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සමඟ අවියෝජනීයව කටයුතු කළ යුතු ආයතනයක් වන්නේ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවයි. STRATLINK දත්ත පද්ධතිය රේගු දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය සමඟ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා අදාළ වන පරිදි තාක්ෂණික පහසුකම ඇති කර ගැනීම අත්‍යවශ්‍ය කටයුත්තක් බැවින්, ඊට අදාළවන යෙදුම් වැඩසටහන් අතුරුමුහුණත් (API - Application Program Interface) වල සංවර්ධන කටයුතු සිදු කරමින් පවතී.

ඒ අනුව, STRATLINK පරිගණක මෘදුකාංග පද්ධතිය 2024 වර්ෂයේදී කඩිනමින් ක්‍රියාකාරීත්වයට පත්කර ගැනීම සඳහා තොරතුරු තාක්ෂණ ඒකකය විසින් එහි නිර්මාපකයින් සමඟ නිරතුරුව සම්බන්ධ වෙමින් ඉතා කාර්යක්ෂම කටයුතු කරමින් සිටි. මෙම අංශයෙන් දැනට සිදුකර ඇති හා ඉදිරියට සිදුකිරීමට නියමිත කාර්යයන් පහත දක්වා ඇත.

- Sri Lanka CERT ආයතනය වෙතින් කරන ලද ඉල්ලීමකට අනුව ,KPMG විගණන ආයතනය විසින් දෙපාර්තමේන්තුවේ දත්ත ආරක්ෂණය සම්බන්ධ විගණනයක් සිදු කිරීම.
- එකී විගණනයෙන් නිරීක්ෂණ වාර්තාවෙහි සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කොට අදාළ වැඩිදියුණු කිරීම් කාර්තු වශයෙන් සිදු කිරීම.
- STRATLINK පද්ධතිය ස්ථාපනය සඳහා එස්තෝනියානු SPINTEK –AS ආයතනය මාර්තු මාසයේ දී ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිත අතර, අදාළ පද්ධතිය ස්ථාපනය කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර හා බාහිර පරිශීලකයන් පද්ධතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ පුහුණු කිරීමට නියමිතය.
- STRATLINK පද්ධතියෙහි දෙපාර්තමේන්තු අවශ්‍යතා අනුව තවදුරටත් සිදුකළ යුතු වැඩිදියුණු කිරීම අදාළ මෘදුකාංග සංවර්ධන ආයතනය සමඟ සම්බන්ධ වෙමින් සිදු කිරීමට නියමිතය.

දෙපාර්තමේන්තුවෙහි මෘදුකාංග දෘඩාංග සහ ජාලකරණය ප්‍රශස්ත අයුරින් පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත

2024 වර්ෂයේ දී සම්පූර්ණයෙන්ම STRATLINK පද්ධතිය නවීනතම පහසුකම් වලින් සමන්විත තොරතුරු තාක්ෂණ මෙවලමක් ලෙස දෙපාර්තමේන්තුවේ සේවාලාභීන් වෙත ලබාදීමට හැකිවනු ඇත.

# 3 පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධන

## 3.1 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු. | | සටහන | සත්‍ය 2023 රු. | සත්‍ය 2022 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | 3,304,992,140 | 3,086,778,408 | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| 2,900,000,000 | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | 3,304,992,140 | 3,086,778,408 | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| 2,900,000,000 | මුළු ආදායම් ලැබීම් (අ) | | 3,304,992,140 | 3,086,778,408 | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 100,498,000 | - | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 6,700,573 | 667,098 | ඒසීඒ-4 |
| 2,800,000 | අත්තිකාරම් ගිණුම් | | 7,890,405 | 5,432,858 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | 3,020,191 | |
| 2,800,000 | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 115,088,978 | 9,120,147 | |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 3,420,081,118 | 3,095,898,555 | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ) | | 3,276,491,226 | 2,969,634,125 | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | 143,589,892 | 126,264,430 | |
| | අඩු කළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | - | - | ඒසීඒ-2(ii) |
| 73,400,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 65,801,629 | 62,904,496 | ඒසීඒ-2(ii) |
| 58,140,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 52,716,131 | 42,719,921 | ඒසීඒ-2(ii) |
| 900,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 860,264 | 926,294 | ඒසීඒ-2(ii) |
| - | පොලී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | ඒසීඒ-2(ii) |
| 132,440,000 | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | 119,378,024 | 106,550,711 | |
| | මූලධන වියදම් | | | | |
| 10,350,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 7,253,342 | 9,388,366 | ඒසීඒ-2(ii) |
| 10,050,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 6,144,224 | 540,610 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 4,500,000 | හැකියා වර්ධනය | 14 | 1,661,943 | 554,208 | ඒසීඒ-2(ii) |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | - | ඒසීඒ-2(ii) |
| 24,900,000 | මුළු මූලධන වියදම් (උ) | | 15,059,509 | 10,483,184 | |
| | තැන්පතු ගෙවීම් | | 8,447,791 | 612,808 | ඒසීඒ-4 |
| 4,000,000 | අත්තිකාරම් ගෙවීම් | | 7,340,006 | 6,094,286 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | 162,328 | 2,857,862 | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 15,950,125 | 9,564,956 | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 150,387,658 | 126,598,851 | |
| - | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | (6,797,766) | (334,421) | |
| | අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය | | (6,797,766) | (334,421) | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | - | - | ඒසීඒ-3 |

1

## 3. 2 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | සත්‍ය 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 56,456,442 | 50,312,218 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 15,305,019 | 15,855,418 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| මුළු වත්කම් | | 71,761,461 | 66,167,636 |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 13,997,946 | 12,638,799 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 56,456,442 | 50,312,218 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 1,307,073 | 3,054,291 |
| වැටුප් පාලන ගිණුම | | - | 162,328 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| මුළු වගකීම් | | 71,761,461 | 66,167,636 |

පිටු අංක 07 සිට 46 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 47 සිට 54 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාතර්‍යාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
|---|---|---|
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2024.02.22 | දිනය : 2024.02.21 | දිනය : 2024.02.21 |

කේ.එම්.එම්. සිරිවර්ධන
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

ටී.ටී. උසුන්මලී දේමසිලා
ආනයන හා අපනයන සැලසුම් ජ...
ආනයන හා අපනයන පාලන දෙපාර්තමේ...

2

## 3.3 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| මුළු බදු ලැබීම් | | 3,304,992,140 | 3,086,778,408 |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | - | - |
| ලාභ | | - | - |
| ආදායම් නොවන ලැබීම් | | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | 3,604,925 | 3,899,360 |
| අග්‍රිම ලැබීම් | | 100,498,000 | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | | 8,443,510 | 6,428,435 |
| තැන්පතු ලැබීම් | | 6,700,573 | 667,098 |
| වැඩ පාලන ගිණුමට ලැබීම් | | - | 3,020,191 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | | **3,424,239,148** | **3,100,793,492** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 115,363,541 | 104,670,459 |
| සහනාධාර සහ මාරුකිරීම් | | 860,264 | 926,294 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 330,700 | 5,514,444 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 3,276,491,226 | 2,969,634,125 |
| අත්තිකාරම් ගෙවීම් | | 7,523,789 | 6,094,316 |
| වැඩ පාලන ගිණුමෙන් ගෙවීම් | | 162,328 | 2,857,862 |
| තැන්පතු ගෙවීම් | | 8,447,791 | 612,808 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | | **3,409,179,639** | **3,090,310,308** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | | **15,059,509** | **10,483,184** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| පොළී | | - | - |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - | - |
| උපණය අයකර ගැනීම් | | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| මූලධන වියදම් | | 15,059,509 | 10,483,184 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | | **15,059,509** | **10,483,184** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | | **(15,059,509)** | **(10,483,184)** |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඈ) + (ඊ) | | - | - |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| දේශීය ණය ගැනීම් | | - | - |
| විදේශීය ණය ගැනීම් | | - | - |
| ප්‍රදානයන් ලැබීම් | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ) | | - | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | | - | - |

3

## 3.4 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය


රු.

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තු වේ % ලෙස |
| 10.01.03.00 | ආනයන හා අපනයන බලපත්‍ර සහ අතිරේක ගාස්තු | 2,600,000,000/- | 2,900,000,000/- | 3,304,992,140/- | 113.9 |

### 3.4.1 පසුගිය වර්ෂ 4 ක ආනයන හා අපනයන පාලන බලපත්‍ර සහ අතිරේක ගාස්තුවල වටිනාකම

රු. '000

| වර්ෂය | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|
| ශුද්ධ ආදායම | 2,025,978 | 2,934,679 | 3,086,778 | 3,304,992 |




දෙපාර්තමේන්තුවේ පසුගිය වසර 3 ක බලපත්‍ර ආදායම පිළිබඳව සලකා බැලීමේදී ආදායමේ ක්‍රමික වැඩිවීමක් දක්නට ලැබේ. **2023** වර්ෂයේ බලපත්‍ර නිකුත් කිරීමෙන් රුපියල් බිලියන **3**.3 ක් වැනි ඉහළ ආදායමක් ඉපයීමට සමත් වී ඇති අතර එය 2022 වර්ෂය සමග සසඳා බැලීමේ දී 7 % ක පමණ වැඩිවීමකි. තවද ආනයන පාලන රෙගුලාසි උල්ලංඝනය කරන ලද අවස්ථාවලදී අතිරේක ගාස්තු අයකිරීම ද සිදුකරන ලදී.

### 3.5 2023 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු.

| ප්‍රතිපාදන වර්ගය | වෙන්කරන ලද ප්‍රතිපාදන | | සත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 132,440,000/- | 133,490,000/- | 119,378,024.14 | 89.4 |
| ප්‍රාග්ධන | 24,900,000/- | 24,900,000/- | 15,059,508.68 | 60.4 |

### 3.6 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන නොමැත.

### 3.7 මුල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු.

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2023 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2023 දිනට මූලය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | - | - | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | - | 53,987,641.63 | | |
| 9153 | ඉඩම් | - | - | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | 1,528,000.00 | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | | |

## 3.8 විගණකාධිපති වාර්තාව


ජාතික විගණන කාර්යාලය

தேசிய கணக்காய்வு அலுவலகம்

NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. PUR/A/IECD/2023/FS/01  ඔබේ අංකය / உமது இல. / Your No.  දිනය / திகதி / Date 2024 මැයි 28 දින.

ආනයන හා අපනයන පාලන ජනරාල්,

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 296 - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 296 - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව  இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

2

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

4

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූලධන වියදම්**

කිසියම් නිශ්චිත ව්‍යාපෘතියක සෘජුවම ප්‍රයෝජනයට ගැනීම සඳහා ද්‍රව්‍ය හා උපකරණ වශයෙන් විදේශ ප්‍රාග්ධන ආධාර ලැබූ කල්හි එම අයිතමයන්ට අදාළ ලිපි ලේඛනවල තොරතුරු පදනම් කරගෙන එකී ප්‍රදානයේ රුපියල් වටිනාකම දෙපාර්තමේන්තුව විසින් නිශ්චිත කළ යුතු අතර එකී අගය යථාර්තවාදී නොවන අවස්ථාවල දී එය විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් ලබාගෙන ඇස්තමේන්තු ගත අගයක් ගණනය කර ගිණුම් ගත කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී ඇමරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය යටතේ ප්‍රදානයක් වශයෙන් ලැබී තිබුණු ඇ.එ.ජ.ඩොලර් 280,000 ක් පමණ වටිනා බලපත්‍ර නිකුත් කිරීමේ පරිගණක දත්ත පද්ධතිය සහ ඊට අදාල ඇ.එ.ජ. ඩොලර් 19,100 ක් වටිනා පරිගණක ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.6.2 මූල්‍ය නොවන වත්කම්**

2022 වර්ෂයේදී වෙන්දේසි කරන ලද පිරිවැය රු.40,000 ක් වූ මෝටර් සයිකලය පොත්වලින් ඉවත් නොකර සමාලෝචිත වර්ෂය අවසාන දිනට වූ මූල්‍ය නොවන වත්කම්වල ඇතුළත් කර තිබුණි.

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 ආදායම් කළමනාකරණය**

සමාලෝචිත වර්ෂයේදී ආදායම් සංකේත අංක 1001-03-00 බලපත්‍ර ආදායම් සඳහා මූලික ඇස්තමේන්තුව රු.2,600,000,000 ක් වූ අතර සංශෝධිත ඇස්තමේන්තුව රු.2,900,000,000ක් වීමෙන් රු.300,000,000 ක විචලතාවයක් නිරීක්ෂණය වූ අතර එය මූලික ඇස්තමේන්තුවෙන් සියයට 12 ක විචලතාවයකි. එබැවින් මූලික ඇස්තමේන්තු සකස් කිරීමේදී හැකිතාක් නිවැරදිව ඇස්තමේන්තු පුරෝකථනය කිරීමේ අවශ්‍යතාව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

**2.2 වියදම් කළමනාකරණය**

**2.2.1 පුනරාවර්තන වියදම්**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදම්හි වැය විෂයයන් 10 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 සිට සියයට 81 ක් දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීමක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වැය විෂයයන් 07 ක මූලික ඇස්තමේන්තු හා සංශෝධිත වියදම් ඇස්තමේන්තු අතර සියයට 22 සිට සියයට 37 ක් දක්වා වූ පරාසයක විචලතාවයක් විය.

5

ඒ අනුව මූලික ඇස්තමේන්තු සකස් කිරීමේදී පසුගිය වර්ෂයන්හි වියදම් පිළිබඳ සමාලෝචනයක් සිදු කර හැකිතාක් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පුරෝකථනය කිරීමේ අවශ්‍යතාවය විගණනයේදී අවධාරණය කෙරේ.

**(ඇ) ඉතිරිවීම් සඳහා ඉදිරිපත් කළ හේතු ප්‍රමාණවත් නොවීම**

වෙන්කරන ලද අයි ප්‍රතිපාදන සහිත වැය විෂයයන් 05 න් මු.රෙ 66/69 අනුව මාරුකිරීම් සිදු කළ පසුව ද, සමාලෝචිත වර්ෂය අවසාන දිනට තවදුරටත් වූ ඉතිරිවීම් සඳහා හේතු වශයෙන් "වියදම් සීමා කිරීමට කටයුතු කළබව " සඳහන් කර තිබුණි.

**2.2.2 මූලධන වියදම්**

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වූ මූලධන වැය විෂයයන් දෙකක මූලික ඇස්තමේන්තු හා සංශෝධිත ඇස්තමේන්තු අතර විචලතාවය සියයට 86 ක් සහ සියයට 363 ක් බැගින් විය. ඒ අනුව මූලික ඇස්තමේන්තු සකස් කිරීමේදී හැකිතාක් නිවැරදිව වියදම් පුරෝකථනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ මූලධන වැය විෂයයන් 05 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 සිට සියයට 63 ක් දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීමක් විය.

**2.2.3 අත්තිකාරම් ගිණුම්**

සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු වර්ෂ 01 සිට 03 දක්වා පැරණි ණය ශේෂය රු.223,269 ක් ද, අවුරුදු 1ට අඩු රු.470,177 ක ණය ශේෂයක් ද විය. තවද, වැඩ තහනම් කළ නිලධාරීන්ගේ ණය ශේෂ ලෙස වර්ෂ 05 ට වඩා පැරණි රු.335,753 ක ශේෂයක් ද, වර්ෂ 01 සිට 03 දක්වා පැරණි රු 238,000 ක ණය ශේෂයක් ද විය. ඒ අනුව ආයතන සංග්‍රහයේ XXIV 4:5 උප වගන්තිය අනුව එම ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. වැඩ තහනම් කළ වසර 05 ට වඩා පැරණි අයවිය යුතු රු. 335,753 ක ශේෂය ගිණුමේ "වෙනත් ණය ශේෂයක්" ලෙස සඳහන් කර තිබුණි.

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මු.රෙ 155 | යොමුගත වගන්තිය ප්‍රකාරව විගණන විමසුම් සඳහා අප්‍රමාදව ක්‍රියාකොට ඒවාට සම්පූර්ණ |

6

| | |
|---|---|
| | පිළිතුරු සැපයීම ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වුවද විමසුම් සඳහා පිළිතුරු සැපයීම මාස 3 කට වඩා ප්‍රමාද වූ අවස්ථා විය. |
| (ආ) 2022 අප්‍රේල් 04 දිනැති අංක 5/2022 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය | රජයේ දේපල අස්ථානගතවීම සහ අවභාවිතය වැළැක්වීම මෙන්ම ඒවා උපරිම ඵලදායීභාවයෙන් ප්‍රයෝජනයට ගැනීම තහවුරු කිරීමට ආයතන ප්‍රධානීන්ට නියම කර තිබියදී, එයට පටහැනිව රු.3,038,690 ක පිරිවැයක් සහිත N1SSAN SYLPHY වර්ගයේ මෝටර් රථය ආයතන අතර විධිමත් වත්කම් හුවමාරුවක් සිදු නොකර 2022 දෙසැම්බර් 05 දින ජනාධිපති ලේකම් කාර්යාලය වෙත භාර දී තිබුණි. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 දැක්ම හා මෙහෙවර

1969 ජනවාරි 16 දිනැති අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනතින් පිහිටුවන ලද දෙපාර්තමේන්තුවේ අරමුණ, දැක්ම හා මෙහෙවර අනුව ශ්‍රී ලංකාවේ ආර්ථිකයට අහිතකර ලෙස බලපාන ආනයනයන් හා අපනයනයන් පාලනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වුවත් එක් එක් විෂයයන්ට අදාලව රජයේ ආයතන විසින් නිකුත් කරනු ලබන නිර්දේශ මත පදනම්ව පමණක් ආනයන බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර තිබුණි. තවද, දෙපාර්තමේන්තුව පිහිටුවීමේ මූලික අරමුණු ඉටුවන ආකාරයට කටයුතු කිරීම සඳහා පිළිගත් විද්‍යාත්මක ක්‍රමවේදයක් හෝ ක්‍රියාපටිපාටියක් සකස් කර නොතිබුණු අතර බලපත්‍ර ගාස්තු අයකිරීම ප්‍රධාන කාර්යය ලෙස සළකා කටයුතු කරමින් රටෙහි සමස්ථ පාරිභෝජනයෙහි පුරෝකථනයන් සිදු කර ප්‍රමාණ පාලනය (Quantity Control) නොකරන බව නිරීක්ෂණය විය.

#### 3.1.2 දෙපාර්තමේන්තුවේ වගකීම් හා කාර්ය භාරය

අපනයන පාලනයට අදාළ රෙගුලාසි ඇතුළත් ගැසට් නිවේදන ප්‍රකාශයට පත් කිරීම සහ එකී රෙගුලාසි වලට යටත්ව මෙරට ආර්ථිකයේ යහපත උදෙසා බලපත්‍ර නිකුත් කිරීම ද දෙපාර්තමේන්තුවේ වගකීම් සහ කාර්ය භාරයන් වශයෙන් දැක්වුවද, දෙපාර්තමේන්තුව ආනයන

7

පාලනයට අදාළ කාර්යයන්හි පමණක් නිරතවී තිබුණු අතර 2017 වසරෙන් පසුව අපනයනයන්ට අදාළ කිසිදු රෙගුලාසියක් නිකුත් කළ බවට සාක්ෂි විගණනයට නිරික්ෂණය නොවුණි.

**4 යහපාලනය**

**4.1 රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීම**

(අ) ඵලදායී තොරතුරු තාක්ෂණික පද්ධතීන් උපයෝගී කර ගනිමින් රජයේ ආදායම එකතු කිරීම, වැඩිදියුණු කිරීම සඳහා පාර්ශවකරුවන් විසින් සහ පාර්ශවකරුවන් අතර ගත යුතු පියවර නිර්දේශ කිරීම සඳහා වූ 2016 නොවැම්බර් මස 23 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අතුරු වාර්තාවේ නියෝග පරිදි "ආයතන විසි අටක සම්බන්ධීකරණය ඇතිව, බලපත්‍ර නිකුත් කිරීමේදී අදාල ආයතන වෙතින් අන්තර්ජාලය ඔස්සේ නිර්දේශ ලිපි ලබා ගැනීමට සැලසුම් සකස් කළ යුතු බව" දන්වා තිබුණද එම නිර්දේශය විගණන දිනය වූ 2024 මාර්තු 31 දින වන විටත් ක්‍රියාත්මක වී නොතිබුණි.

(ආ) නිර්දේශිත කාලය ඉක්ම වූ වාහන සහ කොටස්කර ගෙන්වනු ලබන වාහන ආනයනය සඳහා ප්‍රතිපත්තියක් සකස් කරන ලෙස 2024 ජනවාරි 23 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් නියෝග කර තිබුණ ද, එවැනි ප්‍රතිපත්තියක් සකස්කර නොතිබුණු අතර ඖෂධ නිෂ්පාදනයට ගෙන්වන ස්ප්‍රිතු පිළිබඳ පසු විපරම් කරන ලෙස දැනුම් දී තිබුණ ද, එය ද ඉටුකර නොතිබුණි.

(ඇ) සි ෂෙල්ස් සිට තායිලන්තය දක්වා ගමන් කළ මත්ස්‍යයින් ගබඩා කළ බහාළුම් රැගත් නෞකාවක් කොළඹ වරායට ආසන්න මුහුදු ප්‍රදේශයේ දී කාර්මික දෝෂයකට ලක් වී විදුලි සැපයුම නතර වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ වරාය අධිකාරිය වෙත ළඟා වී තිබුණු අතර විදේශීය නෞකාවේ දේශීය නියෝජිතයා මගින් සොයාගත් දේශීය පෞද්ගලික ආයතනයකට කාබනික පොහොර නිෂ්පාදනය සඳහා මෙම මාළු බහාළුම් 2022 මාර්තු 09 වන දින විකුණා තිබීම පිළිබඳව 2024 ජනවාරි 23 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබා දී තිබුණු පහත සඳහන් නියෝගයන් 2024 මාර්තු 20 දින වන විටත් දෙපාර්තමේන්තුව විසින් ඉටුකර නොතිබුණි.

- ඉවතලන මාළු කොටස් යොදාගෙන පොහොර නිෂ්පාදනය කිරීම සිදුකරනු ලබන අදාළ ආයතනය විසින් මේ වන විට කොපමණ ප්‍රමාණයක පොහොර නිෂ්පාදනය කර තිබේද යන්න පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකිරීම.
- කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොදා නොගත් අප-මාළු (Fish-Waste) අඩංගු බහාලුම් 15 පිළිබඳව සොයා බලා අපහරණය සඳහා නිසි ක්‍රියාමාර්ග ගැනීම.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

8

5 මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

2023 දෙසැම්බර් 31 දිනට අනුමත, තත්‍ය සහ පුරප්පාඩු කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 11 | 3 |
| තෘතියික මට්ටම | 4 | 4 | - |
| ද්විතික මට්ටම | 84 | 75 | 9 |
| ප්‍රාථමික මට්ටම | 20 | 15 | 5 |
| එකතුව | 122 | 105 | 17 |

දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යය මණ්ඩලය 122 වන නමුත් තත්‍ය කාර්යය මණ්ඩලය 105 ක් ව පැවති අතර එදිනට නියෝජ්‍ය/සහකාර පාලක තනතුරට අදාලව පුරප්පාඩු 02ක් සහ නීති නිලධාරි තනතුරට අදාලව පුරප්පාඩුවක් පැවති අතර ද්විතියික මට්ටමේ නිලධාරින් 09 ක් සහ ප්‍රාථමික මට්ටමේ නිලධාරි 05 ක් සඳහා ද පුරප්පාඩු පැවතුණි.

ඊ.එම්.කේ.එම් පද්මලාල්

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට,

ඊ.එම්.කේ.එම්. පද්මලාල්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

## 4 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශකය

### 4.1ආයතනයේ කාර්ය සාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිතදර්ශක | අපේක්ෂිතනිමැවුම් ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% | 49% - 0% |
| ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම හා හර කිරීම | √ | | | |
| ගැසට් ප්‍රකාශනය | √ | | | |
| මාර්ගෝපදේශ හා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම | √ | | | |
| පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | √ | | |

## 5 පරිච්ඡේදය

### තිරසර සංවර්ධන අරමුණු (SDG) සාක්ෂාත් කරගැනීමේ කාර්යසාධනය

2015 වර්ෂයේ පැවැති එක්සත් ජාතීන්ගේ සමුළුවේදී ලෝක රාජ්‍ය නායකයන් විසින් ගෝලීය වශයෙන් 2030 වසරේදී ළඟා විය යුතු තිරසර සංවර්ධන අරමුණු 17 ක් සහ ඉලක්ක 169 ක් හඳුන්වා දෙන ලදී. තිරසර සංවර්ධනය සඳහා 2030 න්‍යාය පත්‍රයෙහි මානවයා, මිහිකත සහ සෞභාග්‍යය වෙනුවෙන් වන්නා වූ ක්‍රියාකාරී සැලසුම්, පුළුල් නිදහස තුළ විශ්වීය සාමය ශක්තිමත් කිරීමේ වැයම්, අන්ත දරිද්‍රතාවය ඇතුළු දිළිඳු බවෙහි ස්වරූපයන් තුරන් කිරීම, මානව හිමිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන්, ගැහැනු ළමුන් සවිබල ගැන්වීම සාක්ෂාත් කර ගැනීම සහ සියලු පාර්ශ්වකරුවන්ගේ සහයෝගී ක්‍රියාකාරිත්වය යනාදිය ඇතුළත් කර ඇත.

ගෝලීය තිරසර සංවර්ධනයට ප්‍රවේශයක් ලෙස ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනයන් ඊට අනුගත වීම සහ දිගුකාලීන සංවර්ධන උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා වූ අවශ්‍යතාවය පිළිබඳව තිරසර සංවර්ධන සභාව අනුග්‍රහයෙන් පවත්වන ලද වැඩමුළු සඳහා මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගී විය. ඒ අනුව දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ කාර්යභාරය පදනම් කරගනිමින් දෙපාර්තමේන්තුවට අදාළ ගෝලීය තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්කයන් තවදුරටත් පුළුල් කරගනිමින් හඳුනාගැනීමක් සිදුවිය. පසුව දෙපාර්තමේන්තු අභිලාෂයන් මුදුන්පත් වන පරිදි දිගුකාලීන දැක්මකින් යුතුව තිරසර සංවර්ධන අරමුණු හා එහි ප්‍රගතිය මැනීම සඳහා වූ නිර්ණායකයන් ස්ථාපිත කර ගන්නා ලදී. ස්ථාපිත කරගත් අරමුණු තුළින් රටේ තිරසර සංවර්ධනය සඳහා වූ කාලීන අවශ්‍යතාවය සැපිරීම උදෙසා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාකාරකම් ආරම්භ කොට ඇත. දෙපාර්තමේන්තුවට අදාළව අරමුණු සකස් කර ගැනීමේදී පාදක කරගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු පහත පරිදි වේ.

### 5.1 හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

#### නගර සහ ජනාවාස පරිපූර්ණ ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම. (තිරසර සංවර්ධන අරමුණු අංක 11)

ජීවත්වීම උදෙසා හිතකර පරිසරයක් රට තුළ ගොඩනැගීම සඳහා වාතයේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සහ නාගරික සහ වෙනත් අපද්‍රව්‍ය කළමනාකරණය සිදුකළ යුතුය. නාගරීකරණය වූ ප්‍රදේශවල රථවාහන භාවිතය ශීඝ්‍රයෙන් ඉහළ යාම හේතුවෙන් එම ප්‍රදේශයන්හි වාතයේ අඩංගු විමෝචන වායුප්‍රතිශතයේද වැඩිවීමක් දක්නට ඇත. මෙහිදී අවධානයට ලක් වූ කරුණ නම් රථවාහනවලින් පිටවන විෂ දුමාරය මගින්

සැළකිය යුතු මට්ටමක වායු දූෂණයක් සිදුවන බවයි. එබැවින් වායු විමෝචන ප්‍රමිතීන්ට අනුකූල නොවන වාහන ආනයනය කිරීම නවතා ඇත. ඒ සඳහා 2019.01.25 දිනැති අංක 2107/45 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් රෙගුලාසි පනවා ඇත.

### තිරසර පරිභෝජනය සහ නිෂ්පාදන රටාවක් සහතික කිරීම. (තිරසර සංවර්ධන අරමුණු අංක 12)

පරිසර හිතකාමී ලෙස රසායනික ද්‍රව්‍ය සහ සියලුම අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම තුළින් මානව සෞඛ්‍යයට සහ පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීමෙන් රජය අපේක්ෂා කරන සංවර්ධන ඉලක්කයන් කරා ළඟාවීමට දෙපාර්තමේන්තුව නියාමන ආයතනයක් ලෙස කටයුතු කරයි. එලෙස බලපෑම් ඇතිකරනු ලබන අයිතම හඳුනාගෙන ඒවා පාලනය හා නියාමනය කිරීම සඳහා ආනයන හා අපනයන බලපත්‍ර පාලනයට යටත් කිරීම, ආනයනය හා අපනයනය සම්පූර්ණයෙන්ම තහනම් කිරීම සහ ආනයන හා අපනයනයට අදාළ ප්‍රමිති නියම කිරීම අනෙකුත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය වෙමින් නිසියාකාරව සිදුකරනු ලබයි.

ඒ අනුව, පරිසර අමාත්‍යාංශය විසින්, 2023 ජනවාරි මස 31 දිනැති අංක 23/0265/622/003 දරන "තනි භාවිත ප්ලාස්ටික්/පොලිතීන් අපද්‍රව්‍ය පාලනය" යන මැයෙන් වූ ඔවුන්ගේ අමාත්‍ය මණ්ඩල සටහනේ දක්වා ඇති යෝජනා සඳහා ලබා ගන්නා ලද අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ප්‍රකාරව, 2023 ජූනි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, ප්ලාස්ටික්වලින් නිර්මිත එක් වරක් පමණක් භාවිත කරන ප්ලාස්ටික් බීම බට, කැලතීමේ උපකරණ , පිඟන්, කෝප්ප (යෝගට් කෝප්ප හැර), යෝගට් හැඳි ඇතුළු හැඳි, ගෑරුප්පු, පිහි සහ ප්ලාස්ටික් මල්මාලා, ප්ලාස්ටික් ඉදිආප්ප වට්ටි ආනයනය කිරීම කිරීම, 2023 අප්‍රේල් මස 06 දිනැති අංක 2326/41 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් තහනම් කර ඇත.

### තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සැම මට්ටමකටම ඵලදායී, වගකීම් සහිත පූර්ණ ආයතන ගොඩනැගීම. (තිරසර සංවර්ධන අරමුණු අංක 16)

සියලුම මට්ටම්වල නිලධාරින්ගේ ක්‍රියාකාරී සහභාගීත්වයෙන් යුත් තීරණ ගැනීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමත්, එම තීරණ නිරන්තර ඇගයීමට භාජනය කිරීමෙන් ඉහළ සඵලත්වයක් තහවුරු කරගැනීමත් දෙපාර්තමේන්තුව ඉලක්ක කර ඇත. කාර්ය මණ්ඩල රැස්වීම් සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් හරහා සියලුම මට්ටම්වල නිලධාරින් තීරණ ගැනීමේ ක්‍රියාවලියට සක්‍රීයව හවුල් කරවා ගැනීමෙන් ඵලදායී වගවීමෙන් යුක්ත හා විනිවිදභාවයෙන් යුත් ආයතනයක් පවත්වා ගෙන යාමට හැකියාව ලැබී ඇත.

පවත්නා නීති පද්ධතියට සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්, ගිවිසුම්වලට අනුකූලව මහජනතාවට තොරතුරු ලබාගැනීමට ඇති අයිතිය පූර්ණ වශයෙන් තහවුරු වන ආකාරයට දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය පහසුකම් එකී පාර්ශ්වයන් වෙත ලබා දී ඇත. දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කරන ලද තොරතුරු ඉතා වගවීමෙන් සහ ඉතා ඉක්මනින් ඉල්ලුම් කරන පාර්ශ්වයන්ගේ අතට පත් කරනු ලබන අතර, දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා ද යාවත්කාලීන තොරතුරු වෙතට පිවිසීමේ හැකියාව සලසා දී ඇත.

### තිරසර සංවර්ධනය සඳහා වූ ගෝලීය සහයෝගිතාවය ක්‍රියාත්මක කිරීමේ අවස්ථාවන් සවිමත් කිරීම සහ පුනර්ජීවනය (තිරසර සංවර්ධන අරමුණු අංක 17)

රජය විසින් අපේක්ෂා කරනු ලබන තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට, ගනු ලබන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, පහසුකම් සැපයීම, සම්බන්ධීකරණය කිරීම හා නියාමනය කිරීම දෙපාර්තමේන්තුවේ වගකීම වේ. මේ යටතේ, රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ නියාමනය නිසියාකාරව සිදු වීම තහවුරු කිරීම, ජාත්‍යන්තර වෙළඳාම සම්බන්ධයෙන් ඇති රෙගුලාසි බලගැන්වීම හා ශක්තිමත් කිරීම යන අරමුණු සුවිශේෂී වේ. එහිදී එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල ප්‍රඥප්ති 1540 මෙන්ම වෙළඳ පහසුකම් සැපයීමේ ගිවිසුම (**Trade Facilitation Agreement** ) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම මඟින් ප්‍රතිපත්ති සම්බන්ධීකරණය කිරීම හා සංගතභාවය තුළින් ජගත් සාර්ව ආර්ථික ස්ථාවරත්වය වැඩිදියුණු කිරීම යන තිරසාර සංවර්ධන අභිමතාර්ථ ළඟාකර ගැනීම සිදුකරනු ලබයි. 1540 යෝජනාව 2023 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කරන ලදී . ඊට සමගාමීව ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම මාර්ගගත ක්‍රමය ඔස්සේ වඩාත් වඩාත් සඵලාදායිව ඉටුකරනු වස් ඇමරිකානු එක්සත් ජනපද තානාපති කාර්යාලය හා සම්බන්ධව **STRATLINK** පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා **STRATLINK** පරිගණක පද්ධතියේ ක්‍රියාකාරීත්වය සම්බන්ධ මූලික මට්ටමේ පුහුණු කිරීම් එස්තෝනියා රජයේ නියෝජිතයින් විසින් සිදු කරන ලදි.

| ඉලක්කය/ අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශකය | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-75% | 76%-100% |
| **11.** නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම. | 11.6 2030 වන විට විශේෂයෙන්ම වාතයේ ගුණාත්මකභාවය සහ නාගරික සහ වෙනත් අපද්‍රව්‍ය කළමනාකරණය ඇතුළත්ව නගර නිසා සිදු වන ඒක පුද්ගල අහිතකර පරිසර බලපෑම අඩු කිරීම. | 1.ප්‍රමිතීන්ට අනුකූල නොවන වාහනනිෂ්කාශනය කිරීමට ඉඩ නොදීම. | | | ✓ |
| **12.** තිරසර පරිභෝජන සහ නිෂ්පාදනරටාව න් සහතික කිරීම. | 12.4 2020 වන විට එකඟතාවයට පත් වී ඇති අන්තර්ජාතික වැඩ සැලැස්මට අනුකූලව පරිසර හිතකාමී අන්දමට රසායනික ද්‍රව්‍ය හා සියලුම අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම ක්‍රියාවට නැංවීම සහ එමඟින් මානව සෞඛ්‍යට සහ පරිසරයට සිදුවන්නා වූ අහිතකර බලපෑම අවම කිරීම සඳහා වාතයට, ජලයට සහ පසට ඒවා මුදා හැරීම අවම කිරීම. | 2. බාසල් සම්මුතිය සමාලෝචනය සම්පූර්ණ කිරීම. | | | ✓ |
| | | 3. අදාළ අධිකාරියේ නිර්දේශය මත පාලනය කරන ලද අයිතම ගණන. | | | ✓ |
| | | 4. ඇල්මක් ඇති පාර්ශ්වයන් සමග පවත්වන ලද උපදේශන රැස්වීම් ගණන. | ✓ | | |
| | | 5. මාණ්ඩලික නිලධාරීන් සමඟ පවත්වන ලද උපදේශන රැස්වීම් ගණන. | | ✓ | |
| | | 6. දැනුවත් කිරීම් සඳහා සිදු කරන ලද ක්‍රියාකාරකම් ගණන. | ✓ | | |
| | 12.5 2030 වන විට අපද්‍රව්‍ය උත්පාදනය වීම වැළක්වීම, අඩු කිරීම, ප්‍රතිචක්‍රීකරණය සහ ඒවා | 7. විද්‍යුත් අපද්‍රව්‍ය ආනයනය අඩු කිරීම සඳහා වර්ෂය තුළ නිකුත් කරන ලද රෙගුලාසි ගණන. | ✓ | | |

| ඉලක්කය/ අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශකය | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%- 49% | 50%- 75% | 76%- 100% |
| | නැවත භාවිතා කිරීම මඟින් අඩු කිරීම. | 8. ප්‍රතික්ෂේප කරන ලද ආනයනික භාවිතා කළ ඉලෙක්ට්‍රොනික අයිතම ගණන (ජංගම දුරකථන, පරිගණක.. ආදිය). | | | ✓ |
| **16. තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායි, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම.** | 16.7 සියලුම මට්ටම්වලදී ප්‍රතිචාරාත්මක, සියලු දෙනා අන්තර්ගතවූ, සහභාගීත්වයෙන් යුත් සහ නියෝජනයෙන් යුත් තීරණ ගැනීමේ ක්‍රියාවලියක් පැවතීම තහවුරු කිරීම. | 9. පවත්වන ලද කාර්ය මණ්ඩල රැස්වීම් ගණන. | | ✓ | |
| | | 10. පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් ගණන. | | ✓ | |
| | 16.10 ජාතික නීති පද්ධතියට සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්, ගිවිසුම්වලට අනුකූලව මහජනතාවට තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම සහ මූලික නිදහස ආරක්ෂා කිරීම තහවුරු කිරීම. | 11. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ කළ ඉල්ලීම් මත දින 14 ක් තුළ ලබාදුන් පිළිතුරුගණන. | | | ✓ |
| | | 12.තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතට අනුව දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ වරින් වර පළ කරන ලද වාර්තා, සංඛ්‍යාලේඛන සහ ප්‍රකාශන ගණන. | ✓ | | |
| **17. තිරසර සංවර්ධනය සඳහා වූ ගෝලීය සහයෝගිතාවය ක්‍රියාත්මක කිරීමේ අවස්ථාවන් සවිමත් කිරීම සහ පුනර්ජීවනය** | 17.1. බදු සහ වෙනත් ආදායම් එක්රැස් කිරීම් වර්ධනය කිරීම සඳහා සංවර්ධනය වෙමින් පවත්නා රටවලට අන්තර්ජාතික සහයෝගය ලබා දීම ඇතුළුව දේශීය සම්පත් සජීවීකරණය. | එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා (UNSCR) 1540 ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම. | | ✓ | |

| ඉලක්කය/ අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශකය | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-75% | 76%-100% |
| | 17.16. විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ද ඇතුළුව සියලුම රටවලට තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා විවිධ පාර්ශ්වයන්ගේ හවුල්කාරිත්වයෙන් දැනුම, පළපුරුද්ද, තාක්ෂණය සහ මූල්‍ය සම්පත් සජීවීකරණය සහ බෙදා ගැනීම ඔස්සේ තිරසර සංවර්ධනය සඳහා වූ ජගත් හවුල්කාරිත්වය වැඩි දියුණු කිරීම. | STRATLINK පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීම | | ✓ | |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

කොවිඩ් 19 ගෝලීය වසංගත තත්ත්වය පහව යාමත් සමඟ ශ්‍රී ලංකා ආර්ථිකයට මුහුණ පෑමට සිදුවූ විදේශ සංචිත අර්බුදය තුළ රාජ්‍ය ආර්ථික ප්‍රතිපත්ති, ආර්ථික, සාමාජීය, දේශපාලන සහ පාරිසරික රටාවන් තුළ ඉතා සීරුවෙන් මෙහෙය වීමට සිදු විය. රාජ්‍ය වියදම් කළමනාකරණය සඳහා දිශානුගත මෙහෙයුම් ඉලක්ක තුළ සේවාලාභින් සහ වෙනත් පහසුකම් සපයන ආයතන සමඟ කාර්යක්ෂම සේවාලාභී ප්‍රඥප්තියක් වෙනුවෙන් කැපවීමට හැකිවීම අප ලද ජයග්‍රහණයකි.

තවද, තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමට දෙපාර්තමේන්තුව වෙත ඇති කාර්යභාරය ඉටු කිරීමේදී වෙනත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය වෙමින් කටයුතු කිරීමට සිදුවේ. එහිදී, යම් යම් කාර්යයන් එම රාජ්‍ය ආයතනවලට පැවරෙන අතර, එම කාර්යයන් ඉටු කිරීමේ ප්‍රගතිය දෙපාර්තමේන්තුවේ ඉලක්ක සැපිරීම කෙරෙහි තීරණාත්මකව බලපානු ලබයි. එම රාජ්‍ය ආයතන, එකී කාර්යයන් ඉටු කිරීම කෙරෙහි දක්වන ප්‍රගතිය අප දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර කරුණක් වන අතර, එය මුහුණ දීමට සිදුව ඇති තවත් අභියෝගයකි. දෙපාර්තමේන්තුව මහත් පරිශ්‍රමයක් දරමින් මෙම අභියෝගයන් ජයගෙන තිරසර සංවර්ධනය කරා ගමන් කරමින් සිටියි.

තවද, දෙපාර්තමේන්තු විෂය පථයට නව තිරසර සංවර්ධන ඉලක්ක කිහිපයක් හඳුන්වාගෙන ඇති අතර, එම ඉලක්ක සම්පූර්ණ කිරීමට අදාළ දර්ශක අධ්‍යයනය කරමින් පවතී.

# 6. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය ආනයන හා අපනයන නියාමනයට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම, බලපත්‍ර නිකුත් කිරීම/ හර කිරීම සහ ආදායම් එක් රැස් කිරීම යන කාර්යයන් ඉටු කිරීම සඳහා තම සක්‍රීය දායකත්වය ලබා දෙන අතර,වඩා කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සේවාලාභීන් වෙත සැපයීම සඳහා වගවීමෙන් හා කැපවීමෙන් යුතුව කටයුතු කරයි. දෙපාර්තමේන්තුවේ 2023.12.31 දිනට සේවක සංඛ්‍යා විස්තරය පහත පරිදි වේ.

| තනතුර , සේවය හා ශ්‍රේණිය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු/ අතිරික්ත |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 14 | 11 | 03 |
| තෘතීය ශ්‍රේණිය | 04 | 04 | 00 |
| ද්විතීය | 84 | 75 | 09 |
| ප්‍රාථමික | 20 | 15 | 05 |
| **එකතුව** | **122** | **105** | **17** |

## 6.2 දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

දෙපාර්තමේන්තුවේ පවත්නා සේවක පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කරන ලෙස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ද, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ද, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් වෙත ද දන්වා යවා ඇත. තවද මානව සම්පත් හිඟය පූර්ණය කිරීම සඳහා පහත පරිදි ක්‍රියා මාර්ග ගන්නා ලදී.

- ආනයන හා අපනයන පාලක (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුර අලුතින් ඇති කරන ලද අතර, ඒ සඳහා බඳවා ගැනීම ද සිදු කරන ලදී.
- නීති නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා ප්‍රතිපාදන ලබා දෙන ලෙස ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් යොමු කර ඇත.
- සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා තාක්ෂණ) තනතුර සඳහා බඳවා ගැනීම් සිදු කරන ලදී.
- පුරප්පාඩුව පැවති පරිපාලන නිලධාරී තනතුර සම්පූර්ණ කිරීමට කටයුතු කරන ලදී.
- පුරප්පාඩුව පැවති භාෂා පරිවර්තක තනතුර සම්පූර්ණ කිරීමට කටයුතු කරන ලදී.
- පුරප්පාඩුව පැවති රියදුරු තනතුරු 03 න් එක් පුරප්පාඩුවක් සඳහා බහුකාර්ය සංවර්ධන සහායකයෙකු බඳවා ගැනීමට කටයුතු කරන ලදී.
- පුරප්පාඩුව පැවති කාර්යාල සේවක සේවයේ තනතුරු 03 සඳහා බහුකාර්ය සංවර්ධන සහායකයින් 03 දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කළ අතර, 2024.01.01 ක්‍රියාත්මක වන පරිදි දින සිට තාවකාලික පත්වීම් ලබා දී ඇත.

පුරප්පාඩු තනතුරුවලින් වැඩි ප්‍රතිශතයක් සම්පූර්ණ කර ගැනීමට හැකි වූ බැවින් හා මනා මානව සම්පත් කළමණාකරණය නිසා 2023 වර්ෂයේ දෙපාර්තමේන්තු කාර්යසාධනය අපේක්ෂිත මට්ටමට ළඟා වීමට හැකි වී ඇත.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

2023 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය හා සෘජුව බැඳෙන පහත සඳහන් කර ඇති වැඩසටහන්/පාඨමාලා සඳහා සේවකයන් යොමු කරවන ලදී

| වැඩසටහන හෝ පාඨමාලාවේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහන කාල සීමාව | සමස්ත ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (දේශීය හා විදේශීය) | නිමැවුම්/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| මොන්ට්‍රියල් සම්මුතිය හා පාලන යාන්ත්‍රණය සම්බන්ධව දැනුවත් කිරීම සහ ආකල්ප හා ධනාත්මක චින්තනය වැඩි දියුණු කිරීමේ පුහුණු වැඩසටහන | 81 | 2023.04.29<br>දින - 01 | - | - | දේශීය | • ඕසෝන් ස්තරය සුරැකීමේ වැදගත්කම ගැන දැනුම<br>• ආකල්ප හා ධනාත්මක චින්තනය වැඩිදියුණු වීම |
| ආනයනයට හා අපනයනයට අදාළව වරාය අධිකාරියේ කාර්ය භාරය | 30 | 2023.04.18<br>2023.04.27<br>දින - 02 | - | - | දේශීය | ආනයනයට හා අපනයනයට අදාළව වරාය අධිකාරියේ කාර්ය භාරය පිළිබඳ දැනුම. |

| වැඩසටහන හෝ පාඨමාලාවේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහන කාල සීමාව | සමස්ත ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (දේශීය හා විදේශීය) | නිමැවුම්/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ බලපත්‍ර නිකුත් කිරීමේ මාර්ගගත ක්‍රියාවලිය | 20 | 2023.05.15 සිට 2023.07.19 දක්වා දින - 04 | - | - | දේශීය | ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ බලපත්‍ර නිකුත් කිරීමේ මාර්ගගත ක්‍රියාවලිය පිළිබඳ දැනුම |
| ශ්‍රී ලංකා රේගුව මගින් භාණ්ඩ ආනයනයට හා අපනයනයට අදාළ ක්‍රියාවලිය පිළිබඳ පුහුණුව | 30 | 2023.16.19 2023.06.26 දින - 02 | - | - | දේශීය | ශ්‍රී ලංකා රේගුව මගින් භාණ්ඩ ආනයනයට හා අපනයනයට අදාළ ක්‍රියාවලිය පිළිබඳ දැනුම |
| 2012 ප්‍රකාශයට පත්කරන ලද ගෙවීම් ක්‍රම පිළිබඳ අතිවිශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන පිළිබඳ සාකච්ඡා කිරීම. (ii-අදියර) | 25 | 2023.07.25 2023.08.09 දින - 02 | - | - | දේශීය | 2012 ප්‍රකාශයට පත්කරන ලද ගෙවීම් ක්‍රම පිළිබඳ අතිවිශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන පිළිබඳ දැනුම |
| ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අතිවිශේෂ ගැසට් පත්‍රයන් ප්‍රකාශයට පත්කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධ න්‍යායාත්මක පුහුණු වැඩසටහන | 23 | 2023.07.24 සිට 2023.08.03 දක්වා දින - 05 | - | - | දේශීය | ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අතිවිශේෂ ගැසට් පත්‍රයන් ප්‍රකාශයට පත්කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධ න්‍යායාත්මක දැනුම |
| ආනයන හා අපනයන දෙපාර්තමේන්තුවේ ආනයන බලපත්‍ර/හරපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය.<br>-ලියාපදිංචිය (Registration)<br>-බලපත්‍ර නිකුත් කිරීම (issuing license)<br>-හරපත්‍ර නිකුත් කිරීම (Issuing debit) | 30 | දින - 10 | - | - | දේශීය | ආනයන හා අපනයන දෙපාර්තමේන්තුවේ ආනයන බලපත්‍ර/හරපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය.<br>-ලියාපදිංචිය (Registration )<br>-බලපත්‍ර නිකුත් කිරීම (issuing license)<br>-හරපත්‍ර නිකුත් කිරීම (Issuing debit) පිළිබඳ දැනුම |
| ගිනි ආරක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | දින - 01 | රු. 4125.00 | | දේශීය | හදිසි ගිනි ගැනීමකදී ක්‍රියා කල යුතු ආකාරය |
| රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 01 | 2023.06.22 සිට දින - 10 | රු. 40000.00 | - | දේශීය | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳදැනුම |
| රාජ්‍ය සේවය ඩිජිටල්කරණය කිරීම පිළිබඳ නිපුණතා අධ්‍යන වැඩසටහන | 40 | 2023.07.31 දින - 01 | - | - | දේශීය | රාජ්‍ය සේවය ඩිජිටල්කරණය කිරීම පිළිබඳ දැනුම |
| STRATLINK පරිගණක මෘදුකාංග පද්ධතිය සම්බන්ධ පුහුණුව | 47 | 2023.09.18 සිට 2023.09.20 දක්වා දින - 03 | රු. 155215.00 | - | දේශීය | STRATLINK පරිගණක මෘදුකාංග පද්ධතියේ ක්‍රියාකාරිත්වය සම්බන්ධ දැනුම. |
| දෙවන භාෂා ප්‍රවීණතාවය (පැය 150 දෙමල භාෂා පාඨමාලාව) | 16 | 2023.11.24 දින සිට ආරම්භ කර ඇත. | - | - | දේශීය | දෙවන භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කිරීම |
| තොරතුරු තාක්ෂණ කමිටුව සඳහා පවත්වනු ලබන පුහුණුව | 10 | 2023.11.09 සිට 2023.12.07 දක්වා දින - 05 | රු. 374287.00 | - | දේශීය | තොරතුරු තාක්ෂණය, දෘඩාංග, මෘදුකාංග පිළිබඳ දැනුම |
| කළමනාකරණ සේවා නිලධාරී - I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා වූ පාඨමාලාව | 07 | 2023.10.16 සිට 2023.10.27 දක්වා දින - 10 | - | - | දේශීය | කළමනාකරණ සේවා නිලධාරී - I ශ්‍රේණියේ නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම හා කාර්යක්ෂමතා කඩඉම් සමත් වීමේ අවශ්‍යතාව සම්පූර්ණ කිරීම |

| වැඩසටහන හෝ පාඨමාලාවේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහන කාල සීමාව | සමස්ත ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (දේශීය හා විදේශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| වැටුප් පරිවර්තනය සම්බන්ධ පුහුණු පාඨමාලාව | 02 | 2023.11.30 සිට දින -02 | රු.19000.00 | - | දේශීය | වැටුප් පරිවර්තනය පිළිබඳ දැනුම |
| බහු ක්ලොරිනීකරණය කළ බයිපීනයිල (පීසීබී) ව්‍යාපෘතිය සම්බන්ධ මෙහෙයුම් කමිටු සඳහා ඔස්ට්‍රියාවේ පැවැති රැස්වීම | 01 | 2023.05.13 සිට 2023.05.19 | - | ඇ.ඩො.200 + රු. 28695.75 | විදේශීය | පීසීබී ව්‍යාපෘතිය සහ එහි උපයෝගිතාවය පිළිබඳ දැනුම |
| ගෝලීය සංවර්ධන මුලපිරීම යටතේ ඩිජිටල් ආර්ථිකය සහ කර්මාන්ත ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් චීනයේ පැවැත්වූ සම්මන්ත්‍රණය | 01 | 2023.06.04 සිට 2023.06.17 | - | ඇ.ඩො.375 + රු. 26673.00 | විදේශීය | සංවර්ධනය වෙමින් පවතින රටවලට ඩිජිටල් කුසලතා ඇති වෘත්තිකයන් පුහුණු කිරීමට උපකාර කිරීම, කාර්මික සංවර්ධනය සඳහා ඩිජිටල් ආර්ථිකය භාවිතා කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීම සහ සයිබර් අවකාශයේ හවුල් ඉරණමක් ඇති ප්‍රජාවක් ගොඩනැගීම ප්‍රවර්ධනය කිරීම සම්බන්ධ දැනුම. |
| භාණ්ඩ හා සේවා පිළිබඳ ජාත්‍යන්තර වෙළඳාම සම්බන්ධයෙන් ඉන්දියාවේ දී පැවත් වූ වැඩසටහන | 01 | 2023.07.24 සිට 2023.07.28 | - | ඇ.ඩො.175 | විදේශීය | භාණ්ඩ හා සේවා පිළිබඳ ජාත්‍යන්තර වෙළඳාමේ සංඛ්‍යාලේඛන පිළිබඳ දත්ත මූලාශ්‍ර සම්පාදනය කිරීමේ තාක්ෂණික ක්‍රම පිළිබඳ ප්‍රායෝගික උපදෙස්, භාණ්ඩ හා සේවා පිළිබඳ ජාත්‍යන්තර වෙළෙඳාම සමඟ සම්බන්ධිත සංකල්ප සහ ආනයන අපනයන පාලනය කිරීම සඳහා වූ පරිචයන් පිළිබඳ දැනුම |
| මැලේසියාවේ පැවැති උපාය මාර්ගික වෙළඳ සමුළුව (MySTS) | 01 | 2023.10.23 සිට 2023.10.27 | - | ඇ.ඩො.240 | විදේශීය | වෙළඳ සහ සැපයුම් දාම ආරක්ෂාව, සයිබර් ආරක්ෂාව පිළිබඳ අපනයන පාලන අස්පෘශ්‍ය තාක්ෂණ හුවමාරුව සහ තාක්ෂණ පාලන සැලසුම් සම්බන්ධව දැනුම්වත් භාවය ලබාගැනීම |
| සංවර්ධනය වෙමින් පවතින රටවල රේගු කළමනාකරණ පිළිබඳ චීනයේ පැවැති සම්මන්ත්‍රණය (චීනය) | 02 | 2023.10.26 සිට 2023.11.08 | - | ඇ.ඩො.750 + රු. 30000.00 | විදේශීය | සංවර්ධනය වෙමින් පවතින රටවල රේගු කළමනාකරණය සිදු කිරීම සම්බන්ධ දැනුම |
| සැපයුම්දාම කළමනාකරණ පිළිබඳ සිංගප්පූරුවේ පැවැති පුහුණුව | 01 | 2023.11.20 සිට 2023.11.24 | - | - | විදේශීය | ඩිජිටල් ආර්ථිකය සහ කර්මාන්ත ඒකාබද්ධ කිරීම ජාත්‍යන්තර සහයෝගීතාවය සහ දැනුම බෙදාගැනීම පෝෂණය කිරීම තොරතුරු අත්දැකීම් ලබා ගැනීම. |

# 7 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය(අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 01 | පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ. | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් ( වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.6 | වෙනත් | - | | |
| 02 | පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම් (මු.රෙ. 445) | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛනය / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනයයාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 03 | මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135) | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිනඩි මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය(අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරිම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 04 | වාර්ෂික සැලසුම් සකස් කිරිම | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරිම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරිම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරිම | අනුකූල වේ | | |
| 05 | විගණන විමසුම් | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබිම. | අනුකූල නොවේ | විවිධ අංශවලින් පිළිතුරු ලබා ගැනීමේ දී ප්‍රමාදයන් සිදුවීම | ප්‍රමාදවීම්වලින් තොරව ඉදිරියේ දී පිළිතුරු ලබා දෙන ලෙසට නිලධාරීන් දැනුවත් කරන ලදී. |
| 06 | අභ්‍යන්තර විගණනය | | | |
| 6.1 | මු.රෙ. 134(2)DMA/1-2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව,අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මු.රෙ. 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 07 | විගණන හා කළමනාකරණ කමිටු | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණකමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| 08 | වත්කම් කළමනාකරණය | | | |
| 8.1 | අංක 01/2017දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්කම කිරිම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳව තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය(අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරිම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **8.4** | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| **8.5** | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරිම | අනුකූල වේ | | |
| 09 | වාහන කළමනාකරණය | | | |
| **9.1** | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **9.2** | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| **9.3** | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **9.4** | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **9.5** | 2016.12.29දිනැති චක්‍රලේඛ අංක 2016/30දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3:1ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| **9.6** | කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |
| 10 | බැංකු ගිණුම් කළමනාකරණය | | | |
| **10.1** | නියමිත දිනට බැංකු ගිණුම් සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **10.2** | සමාලෝචිත වර්ෂයේ දී ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **10.3** | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 11 | ප්‍රතිපාදන උපයෝජනය | | | |
| **11.1** | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| **11.2** | මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තකාරම් ගිණුම්** | | | |
| **12.1** | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| **12.2** | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය(අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරිම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **12.3** | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | සේවය අත්හිටවන ලද නිලධරය න්ගේ ණය ශේෂ පැවතීම | ණය ශේෂ පියවා ගැනීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. |
| 13 | පොදු තැන්පත් ගිණුම් | | | |
| **13.1** | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| **13.2** | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 14 | අග්‍රිම ගිණුම් | | | |
| **14.1** | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| **14.2** | මු.රෙ.371ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන්වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | | ඉදිරියේ දී එවැනි තත්ත්වයක් ඇති නොවීමට නිලධාරීන් දැනුවත් කර ඇත. |
| **14.3** | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| **14.4** | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | | |
| 15 | ආදායම් අග්‍රිම | | | |
| **15.1** | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| **15.2** | රැස් කර තිබූ ආදායම්. තැන්පත් ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| **15.3** | මු.රෙ.176 අනුව හිඟ අදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 16 | මානව සම්පත් කළමනාකරණය | | | |
| **16.1** | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **16.2** | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| **16.3** | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| **17.1** | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය(අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **17.2** | ආයතන පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳව මහජනතාවගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| **17.3** | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම | | | |
| **18.1** | අංක 05/2008හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම | අනුකූල වේ | | |
| **18.2** | එම චක්‍රලේඛනයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19 | මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම | | | |
| **19.1** | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| **19.2** | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| **19.3** | ඉහත සඳහන් චක්‍රලේඛයේ අමුණුම් 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| **19.4** | ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| 20 | විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම | | | |
| **20.1** | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ | | |

## සමාප්ති සටහන

මෙරට ආරක්ෂාව, ආර්ථිකය, මහජන සෞඛ්‍යය, පරිසර සංරක්ෂණය යනාදී කරුණු ඔස්සේ තිරසාරත්වය ඇති කරනු පිණිස ආනයන සහ අපනයන නියාමනය තුළින් මෙම දෙපාර්තමේන්තුව සුවිශාල දායකත්වයක් ලබාදේ.

පසුගිය වසරවල මුහුණ දුන් ගෝලීය වසංගතයක් සමඟ මෙරට ආර්ථිකය කෙරෙහි ඇති වූ අහිතකර බලපෑම අභිමුව රටෙහි පැවැති මූල්‍ය අර්බුදයන්ට සුවිශාල විභවයකින් යුතුව විසඳුම් සෙවීමට දෙපාර්තමේන්තුවේ විෂයපථය තුළ කාර්ය මණ්ඩලයට හැකියාවක් ලැබිණි. ඒ අනුව ආනයන හා අපනයන පාලන පනත යටතේ මෙම අවස්ථාවට උචිත පරිදි පවතින ආර්ථිකය කළමනාකරණය උදෙසා පාලන රෙගුලාසි පනවමින් ආනයන සීමා කිරීම් කරන ලදී. අන්තර්ජාතික ගෙවීම් ක්‍රම සම්බන්ධයෙන් නිරන්තර අවධානයකින් කටයුතු කරමින් කලින් කලට ගෙවීම් ක්‍රමවලට අදාළව පාලන රෙගුලාසි ක්‍රියාත්මක කරමින්ද , ආනයන සීමා කරන ලද භාණ්ඩවලට පැවති රෙගුලාසි ක්‍රමිකව ලිහිල් කරමින්ද 2023 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව විසින් ස්වකීය කර්තව්‍යය නොපිරිහෙළා ඉටු කරන ලදී.

නිසි දැක්මක් මත නිසි මෙහෙවරකට අනුගත වෙමින් රාජ්‍ය යාන්ත්‍රණයට සහයෝගය දක්වමින් මහජනතාව වෙත ප්‍රශස්ත සේවාවක් ලබාදීම සඳහා දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය අන්‍යෝන්‍ය සහයෝගයෙන් යුතුව කටයුතු කරන ලදී.

තවද, දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය ස්වකීය රාජකාරිය අනලස්ව උද්යෝගීව ඉටුකරනු පිණිසත් ඔවුන්ගේ දැනුම හා කුසලතාවයන් තවදුරටත් වර්ධනය කරලනු පිණිසත්, සුබසාධක සංගමයේ ද සෘජු දායකත්වය හා මෙහෙයවීම ලබා ගනිමින් මෙම වර්ෂයේ දී විවිධ වැඩසටහන් පැවැත්වීමට කටයුතු කරන ලදී.

බලපත්‍ර නිකුත් කිරීමේ නව මාර්ගගත ක්‍රමවේදය 2024 වසර තුළ පූර්ණ වශයෙන් ස්ථාපිත කර අවසන් කිරීමට අපේක්ෂිත අතර, එමඟින් මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වඩාත් නිරවද්‍යව, කාර්යක්ෂම සහ මහජන හිතකාමී ලෙස තවදුරටත් ඉටු කිරීමට හැකිවනු ඇත.